ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය
කොළඹ



# ග්‍රාමීය මට්ටමෙහි කෘෂිකාර්මික සැලසුම් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීමෙහිලා ගොවිකාරක සභාවල කාර්යභාරය

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් කෑගල්ල දිස්ත්‍රික්කයේ පවත්වාගෙන යන බැමිණිවත්ත ක්ෂෙත්‍ර පර්යේෂණ ප්‍රදේශයෙහි කොහොල් පන්සල හා අළුත්නුවර ගොවිකාරක සභා පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

විල්බට් ගුණරත්න
තිලක් ගුණවර්ධන
ර්ග්ල රොනර්

වාර ප්‍රකාශන මාලා - අංක 3 පෙබරවාරි 1974

මිල රු: 2.00

2009/06

# ග්‍රාමීය මට්ටමෙහි කෘෂිකාර්මික සැලසුම් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීමෙහි ලා ගොවි කාරක සභාවල කාර්ය භාරය

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින්

කෑගල්ල දිස්ත්‍රික්කයේ පවත්වාගෙන යන

**බැමිණිවත්ත ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථාන ප්‍රදේශයෙහි**

කෙහෙල්පත්තල හා අළුත්නුවර ගොවි කාරක සභා

පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයකි

විල්බට් ගුණරත්න
තිලක් ගුණවර්ධන
ර්ගීල රොන්ජි

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
33, විලියම් පාර,
කොළඹ 5.

22905
22905

## පටුන

| | | | | පිටුව |
|---|---|---|---|---|
| පෙරවදන | ... | ... | | I |
| ස්තුතිය | ... | ... | | II |
| 1. | හැඳින්වීම | ... | | 1 |
| 2. | කෙහෙල්පන්නල ගොවි කාරක සභාව | | | 7 |
| 3. | අළුත්නුවර ගොවි කාරක සභාව | | | 19 |
| 4. | නිගමන සහ නිර්දේශ | ... | | 26 |
| | උපලේඛන I | ... | | 32 |
| | උපලේඛන II | ... | | 33 |

# පෙ ර ව ද න

වාර්ෂික කෘෂිකාර්මික නිෂ්පාදන වැඩ පිළිවෙල සකස් කිරීමෙහි සහ එය ක්‍රියාත්මක කිරීමෙහි නියැලී සිටින ග්‍රාමීය මට්ටමේ ආයතනය ලෙස ගොවි කාරක සභාවත් එම බල ප්‍රදේශයත් උපයෝගී කර ගැනීමට අවුරුදු හතක පමණ කාලයක් තිස්සේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් උත්සාහ දරා ඇත. රට "මහා යුද්ධයක" නියැලී සිටින මේ අවධියේදී, ඒ ඒ ප්‍රදේශය තුළ කෘෂිකාර්මික වැඩ පිළිවෙල සකස් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී, ගොවි කාරක සභා විසින් ඉටු කරනු ලබන කාර්ය භාරය කුමක් ද යන්න සුළුවෙන් වුවද විමසා බැලීම යෝග්‍ය යැයි ආයතනය විසින් කල්පනා කරන ලදී. එසේම ආයතනය විසින් එකඟ වන ලද පර්යේෂණ වැඩ පිළිවෙල අනුව මේ අධ්‍යයනය භාර ගැනීම සඳහා තවත් අතිරේක හේතුවක් තිබේ. තෝරා ගන්නා ලද ගොවි කාරක සභා දෙක පිහිටා ඇත්තේ කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි බැමිණිවත්ත ක්ෂේත්‍ර පර්යේෂණ ප්‍රදේශය තුළය. මේ ප්‍රදේශයේ සිටින ගොවීන්ගේ ගැටළු පිළිබඳව අන්තර්-විෂයානුකූලව, ඉතා සූපරීක්ෂාකාරීව විමසා බැලීමට ආයතනය උත්සාහ කරයි. මේ නිසා මේ ගොවි කාරක සභා දෙක පිළිබඳ අධ්‍යයනය බැමිණිවත්ත ක්ෂේත්‍ර පර්යේෂණ ප්‍රදේශය තුළ කරනු ලබන වැඩ පිළිවෙලෙහි කොටසක් ලෙස සැලකිය හැකිය.

මේ අධ්‍යයනයෙහි නොයෙකුත් සීමාවන් ඇති බව පැහැදිලිය. කෙසේ වුවද ග්‍රාමීය මට්ටමේදී කෘෂිකාර්මික සංවර්ධනය සංවිධානය කිරීමෙහි ලා ගොවි කාරක සභා උපයෝගී කර ගැනීමට අදහස් කරන සැලසුම් සම්පාදකයන්ට මුහුණ පාන්නට වන වැදගත් ගැටළු කිහිපයක් කෙරෙහි මෙයින් අවධානය යොමු කරන බව ආයතනයේ විශ්වාසයයි.

අධ්‍යක්ෂ

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
33, වලිබැන්ක් පාර,
කොළඹ 5.
ශ්‍රී ලංකාව.

# ස්තූතිය

මෙම අධ්‍යයනය කළ හැකි වූයේ ගොවි කාරක සභා දෙකෙහි නිලධාරීන්, කාරක සභිකයින්, පාලක ලේකම්වරුන්, මේ ප්‍රදේශ දෙකෙහි ග්‍රාම සේවක වරුන් හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයන් ද, විශේෂයෙන්ම ප්‍රදේශයේ ගොවි මහතුන් ද අපට දක්වන ලද අනුග්‍රහය නිසාය. මොවුන්ගෙන් ලද සහයෝගය සහ අනුග්‍රහය ස්තූති පූර්වකව සිහිපත් කරමු.

මේ වාර්තාවෙහි කෙටුම්පත කියවා බලා අදහස් ඉදිරිපත් කළ අපේ සහෝදර පර්යේෂණ නිලධාරීන්ට ද මේ ගැන අදහස් දැක්වීමෙන් හා ධෛර්ය දීමෙන් අපට උදව් කළ අධ්‍යක්ෂ මහතාට ද අපේ කෘතඥතාවය හිමි වේ.

මෙම සිංහල අනුවාදය සකස් කිරීමේදී සහාය දුන් පර්යේෂණ නිලධාරී කේ.වියුඩර් සිල්වා මහතාට ද අපි ස්තූතිවන්ත වෙමු.

# 1. හැඳින්වීම

## 1.1 සාමාන්‍ය

මෙය වූ කලී කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටි කෙහෙල්පන්නල හා අළුත්නුවර යන ගොවි කාරක සභා දෙක පිළිබඳ අධ්‍යයනයකි. මෙය අංග සම්පූර්ණ අධ්‍යයනයක් යැයි අපි අදහස් නො කරමු. නමුත් අප විසින් මේ අධ්‍යයනය කරන ලද්දේ ප්‍රායෝගික වූත් සහ ක්ෂණික වැදගත් කමකින් යුක්ත වූත් තොරතුරු රැසක් එකතු කර ගැනීම සඳහාය. මෙහිදී අපගේ මූලික අවධානය යොමු වූයේ කෘෂිකාර්මික නිෂ්පාදන වැඩ පිළිවෙල ක්‍රියාත්මක වන ආකාරය කෙරෙහිය. මේ ගොවි කාරක සභා දෙක තෝරා ගත්තේ කුමන පදනමක් යටතේ ද යන්න සහ විමර්ශනය සඳහා අප විසින් යොදා ගත් ක්‍රම වේදය කුමක් ද යන්න පසුව විස්තර වේ.

1958 සම්මත වූ කුඹුරු පනත යටතේ පිහිටුවන ලද ගොවි කාරක සභා වී ගොවිතැන නගා සිටුවීම සඳහාත් කුඹුරු පනත යටතේ ඉඩම් භුක්තිය පිළිබඳ කොන්දේසි ක්‍රියාත්මක කිරීම සඳහාත් ග්‍රාමීය මට්ටමේ ගොවි ආයතනයන් වනු ඇතැයි අපේක්ෂා කරන ලදී. ගොවි කාරක සභා වූ කලී ගොවීන් අතුරින්, ඡන්දයෙන් තෝරා ගත් 12 දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයකි. ඉඩම් හිමියන් මෙන්ම අඳ ගොවීන් ද මේවාට ඇතුලත්ය. ගොවි කාරක සභා පිහිටවීමෙන් පසු, ග්‍රාමීය මට්ටමේ ඇති ගොවි ආයතනයක් ලෙස ඒවායේ කාර්යක්ෂමතාව පිරික්සා බලනු සඳහා සමීක්ෂණයන් කිහිපයක් කරන ලදී. නමුත් අවාසනාවකට මෙන් මේවා බොහොමයක් ප්‍රකාශනයට පත් නොකළ එමෙන්ම ලබා ගැනීමට අපහසු වාර්තාවන්ය.(1) ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ විශේෂඥයකු විසින් කර ඇති සමීක්ෂණයක වාර්තාව පමණක් දැනට ප්‍රකාශනයට පත් වී ඇත.(2)

දශකයකටත් වැඩි කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ සැලසුම් හා ප්‍රතිපත්ති සම්පාදකයන් රටේ නිර්යාත නොවන සම්ප්‍රදායික කෘෂිකාර්මික අංශය දියුණු කිරීම සඳහා බලවත් උනන්දුවක් දක්වන ලදී. නිර්යාත නොවන කෘෂිකාර්මික අංශය සංවර්ධනය කිරීමේ මුළු බර ග්‍රාමීය නිෂ්පාදකයා පිට පැටවෙන බවත්, ආයෝජන සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ආධාරක සේවාවන් දියුණු කිරීම හා ව්‍යාප්ත කිරීම රාජ්‍ය ප්‍රතිපත්තියේ අරමුණ වන බවත් 1959(3) පල කළ දස අවුරුදු සැලැස්මෙන් පෙන්වා දෙන ලදී. එහෙත් මේ සංවර්ධන වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම සඳහා ගැමියන්ගේ සහභාගිත්වය ලබා ගැනීම ගැන හෝ එහිදී මතු වන ගැටළු ගැන හෝ මේ සැලැස්ම විශේෂ අවධානය යොමු කළේ නැත. ආර්ථික සංවර්ධනය සඳහා

---

1. Survey of Cultivation Committees – ගොවිජන සේවා දෙපාර්තමේන්තුව 1966

2. Ameer Raza – Evaluation of the Paddy Lands Act – Report to the Government of Ceylon, FAO, Rome, 1970

3. Ten Year Plan 1959 – 58 පිටුව

ජනතාවගේ දැඩි සහයෝගය ලබා ගැනීමේ වැදගත්කම "1962 කෙටි කාලීන ක්‍රියාත්මක වැඩ පිළිවෙල" මගින් අවධාරනය කරන ලදී.(4) බොහෝ දේ කර ගැනීම සඳහා යෙදිය හැකි උපක්‍රමයක් ලෙස එය සලකන ලදී.

ගැමි ජනතාවගේ සහභාගිත්වය ලබා ගැනීම ඇතැම් සැලසුම්වල අරමුණ වූ නමුත්, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා සැලසුම් සම්පාදනය කිරීම ඇත්ත වශයෙන්ම කරන ලද්දේ මධ්‍යම ආණ්ඩුව විසිනි. කෘෂිකාර්මික සැලසුම්වලට ජීවය ලැබෙන්නේ ඒවා ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටම්වලදී ක්‍රියාත්මක වීම තුලින් බව අමුතුවෙන් කිව යුතු නැත. මධ්‍යම ආණ්ඩුවෙන් පමණක් සැලසුම් සම්පාදනය කරනවිට භෞතික සාධක, සමාජ ආර්ථික තත්වයන් හා අවශ්‍යතාවයන් හා හැකියාවන් අතින් ප්‍රදේශයෙන් ප්‍රදේශයට ඇති විවිධත්වය සැලකිල්ලට ලක් වන්නේ නැත. කෘෂිකාර්මික සැලසුම් සම්පාදනය ග්‍රාමීය මට්ටමෙන් කිරීමේ අවශ්‍යතාවය ප්‍රථම වරට පෙන්වා දෙන ලද්දේ 1958 කෘෂිකාර්මික සැලැස්මේ පෙරවදනෙහි.(5) ගමට ගැලපෙන සංවර්ධන සැලැස්මක් ඇති අවශ්‍යතාව මෙහිදී පෙන්වා දෙන ලදී. සෑම ගමකම සැලසුම් සම්පාදනය සහ සංවර්ධන ඒකකයක් ලෙස විවිධ සේවා සමිති පිහිටුවීම සඳහා මූලික රාමුවක් මෙහිදී ඉදිරිපත් විය.(6)

ගොවි කාරක සභා සංවිධානය කිරීම රජයේ දෙපාර්තමේන්තුවක විශේෂ වගකීමක් බවට පත් කරන ලදී. එම දෙපාර්තමේන්තුව නම් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය යටතේ පිහිටුවනු ලද ගොවිජන සේවා දෙපාර්තමේන්තුවයි. ගොවි කාරක සභා නොයෙක් කටයුතුවල නියැලෙනු ඇතැයි අපේක්ෂා කරන ලදී. ඒ ගොවිතැනට කෙළින්ම සම්බන්ධකමක් ඇති සුළු වාරිමාර්ග තැනීම, ජල පාලනය සහ ඉඩම් භුක්තිය පිළිබඳ ගැටළු විසඳීම මේවායින් සමහරකි. නමුත් ග්‍රාමීය අංශය දියුණු කිරීම සඳහා ඇති ජාතික කෘෂිකාර්මික වැඩ පිළිවෙල සමඟ මේ උත්සාහයන් කිට්ටුවෙන් සම්බන්ධ කළේ නැත. ගොවි කාරක සභාවල සහභාගිත්වය ලබා ගැනීමට උත්සාහයක් ගන්නා ලද්දේ 1968 දී කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මෙහෙයවන ලද වාර්ෂික කෘෂිකාර්මික නිෂ්පාදන වැඩ පිළිවෙල සකස් කිරීමේදීය. සෑම අවුරුද්දකම යල සහ මහ කන්න සඳහා වාර්ෂික ක්‍රියාත්මක වැඩ පිළිවෙල සකස් කිරීමේ මූලික වගකීම එවක් පටන් අද දක්වා දරණ ලද්දේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසිනි. මේ වාර්ෂික ක්‍රියාත්මක වැඩ පිළිවෙල විසින් ග්‍රාමීය මට්ටමේ කෘෂිකාර්මික දියුණුව සැකසීම සඳහා කිසියම් පදනමක් සකස් කරන ලදී. වාර්ෂික ක්‍රියාත්මක වැඩ පිළිවෙල සකස් කිරීමේදී දිවයින පුරා ඇති ගොවි කාරක සභාවල සහභාගිත්වය ද ලබා ගැනීමට බලවත් උත්සාහයක් කරන ලදී.

---

4. Short Term Implementation Programme 1962 – ජාතික සැලසුම් සම්පාදන දෙපාර්තමේන්තුව. 1962
5. Agricultural Plan – ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශය, 1958
6. ඉහත සඳහන් සැලැස්මෙහි ග්‍රාමීය සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කොට ඇති ප්‍රශ්න මාලාව බලන්න.

මේ වාර්ෂික ක්‍රියාත්මක වැඩ පිළිවෙල මුලදී වී නිෂ්පාදනය ගැන පමණක් සැලකිලිමත් වූ නමුදු වසරෙන් වසර එහි ක්ෂේත්‍රය පුළුල් වූ අතර සකස් කිරීමේ ක්‍රියා පිළිවෙලෙහි ද දියුණුවක් ඇති විය.[7] ග්‍රාමීය මට්ටමේ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගැටළු, විශේෂයෙන් ගොවි කාරක සභා තුළින් මේවා ක්‍රියාත්මක කිරීමේ ගැටළු පරීක්ෂණයට ලක් කිරීමේ මූලික මාර්ගය වූයේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සකසන ලද වාර්ෂික ක්‍රියාත්මක වැඩ පිළිවෙල යයි කීවොත් එය අසත්‍යයක් නොවේ. ප්‍රාදේශීය මට්ටමේදීත්, දිස්ත්‍රික් මට්ටමේදීත්, ජාතික මට්ටමේදීත් වාර්ෂිකව සකසන ලද මේ ලිපි ලේඛනවල කෘෂිකාර්මික ක්‍රියාත්මක වැඩ පිළිවෙලවල් සකස් කරන ආකාරය පිළිබඳවත්, ඒවා සකස් කිරීමේදී මතු වන ගැටළු පිළිබඳවත් තොරතුරු රාශියක් අඩංගු වේ.[8]

මෑත කාලයේදී කෘෂිකර්ම සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්තීන් වෙනස් වූ ආකාරය අවබෝධ කර ගැනීමට කැමති අය විසින් කෘෂිකාර්මික සංවර්ධන සැලැස්මේ 1971-77 කෙටුම්පතෙහි ඇති යථා දර්ශන සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්ති නමැති පරිච්ඡේදය බැලිය යුතුය.[9]


ගොවි කාරක සභා පිහිටුවීම පිළිබඳවත්, කෘෂිකාර්මික අංශයෙහි වාර්ෂික ක්‍රියාත්මක වැඩ පිළිවෙලවල් සංවර්ධනය වූ ආකාරය පිළිබඳවත් අවධානය යොමු කරන මේ කෙටි හැඳින්වීම කරන ලද්දේ ගොවි කාරක සභා දෙකක් පිළිබඳව කරන මේ අධ්‍යයනය කිසියම් රාමුවක් තුළ තැබීමට එයින් ඉඩ ලැබෙන බැවිනි.

මේ අධ්‍යයනයේ අරමුණු නම්:

1. ග්‍රාමීය මට්ටමේ සැලසුම් සම්පාදන ආයතනයන් වශයෙන් ගොවි කාරක සභාවල කාර්යක්ෂමතාවය පරීක්ෂා කර බැලීම;
2. ප්‍රාදේශීය කෘෂිකාර්මික ක්‍රියාත්මක වැඩ පිළිවෙල සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රමය පිළිබඳව විභාග කර බැලීම;
3. ග්‍රාමීය මට්ටමේ කෘෂිකාර්මික සැලසුම් සම්පාදනයේදී සැලකිල්ලට ගත යුතු වැදගත් සාධක මොනවාදැයි හඳුනා ගැනීම ආදියයි.

---

7. ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශය සහ එයට පසුව පිහිටුවන ලද කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය විසින් 1968-73 දක්වා නිකුත් කරන ලද වාර්ෂික ක්‍රියාත්මක වැඩ පිළිවෙලවල් බලන්න.
8. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 1968-73 දක්වා සෑම වසරක් සඳහාම නිකුත් කරන ලද වාර්ෂික ක්‍රියාත්මක වැඩ පිළිවෙලවල්වල පෙරවදන් බලන්න. දිස්ත්‍රික් ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් ලෙස 1973 දී දිසාපති තුමා සහ දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුව විසින් හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා නිකුත් කරන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වැඩ පිළිවෙල බලන්න.
9. Draft Agricultural Development Plan 1971-77



ශ්‍රී ලංකාව
වියළි
කලාපය
මහනුවර
කෑගල්ල දිස්ත්‍රික්කය
කොළඹ
තෙත්
කලාපය

## 1.2 ක්‍රම වේදය

මෙය වූ කලී කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටි බැම්මිවත්ත ක්ෂේත්‍ර පරීයේෂණ ප්‍රදේශය තුළ ඇති ගොවි කාරක සභා දෙකක් පිළිබඳ අධ්‍යයනයකි. ප්‍රදේශයේ උප දිසාපති තුමා සහ තවත් වෙනත් ප්‍රාදේශීය නිලධාරීන් ද, එලදා වර්ධන කමිටුව ද විමසා බලා, සාර්ථක පදනමක් යටතේ මේ ගොවි කාරක සභා දෙක තෝරා ගන්නා ලදී. මේ දෙක තෝරා ගන්නා ලද්දේ කාර්යක්ෂමතාවය පිළිබඳ පුළුල් නිගමනයන් වහල් කොට ගැනීමෙනි. එකක් වඩාත් කාර්යක්ෂම නිසාත් අනෙක එහි අකාර්යක්ෂමතාවය නිසාත් තෝරා ගන්නා ලදී. තෝරා ගන්නා ලද ගොවි කාරක සභා දෙක නම් කෙහෙල්පන්නල සහ අළුත් නුවරයි.


මේ අධ්‍යයනය සඳහා අවශ්‍ය තොරතුරු කිහිප ආකාරයකින්ම ලබා ගන්නා ලදී:-

1. එක් එක් ගොවි කාරක සභා ප්‍රදේශය තුළ සිටින ගොවීන්ගෙන් 10% ක නියදයන් නියමු සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීම;
2. ගොවි කාරක සභාවේ නිලධාරීන් සහ සාමාජිකයන්, පාලක ලේකම්වරුන්, ග්‍රාම සේවක වරුන්, සමුපකාර සමිතිවල නිලධාරීන් සහ කළමනාකරුවන් හා කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් සමඟ සාකච්ඡා කිරීම;
3. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ සහ මේ ගොවි කාරක සභා දෙකෙහි ලිපි ගොනු පරීක්ෂා කිරීම.

## 1.3 සීමාවන්

1. සමහරවිට දිවයිනෙහි බොහෝ ගොවි කාරක සභා මෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවි කාරක සභා පවා, මෙම ගොවි කාරක සභා දෙක මගින් නියෝජනය නො කෙරෙන සුළු විය හැක. එමනිසා මෙම අධ්‍යයනය සාමාන්‍ය නිගමනයන් ගැනීමේදී සුපරීක්ෂාකාරී වීම අවශ්‍ය වේ.
2. මෙම අධ්‍යයනය නියමු පරීක්ෂණයක ස්වභාවයක් දරන නිසා අංග සම්පූර්ණ අධ්‍යයනයක් ලෙස සැලකිය නොහැක.
3. අළුත්නුවර ගොවි කාරක සභාවේ කාර්යශීලී සහයෝගය මැනවින් නො ලැබුණ නිසා එම ගොවි කාරක සභාව ගැන එකතු කරන ලද දත්ත සීමිත වෙයි.

කෙහෙල්පන්නල ගොවි කාරක සභා ප්‍රදේශය




කුඹුරු

## 2. කෙහෙල්පන්නල ගොවි කාරක සභාව

### 1. ගොවි කාරක සභා ප්‍රදේශය පිළිබඳ පසුබිම :-

කෙහෙල්පන්නල ගොවි කාරක සභා ප්‍රදේශය පිහිටියේ බැම්මිවත්ත ක්ෂේත්‍ර පර්යේෂණ ප්‍රදේශයෙහි ගිනිකොන දිග භාගයෙහිය. එය කෙහෙල්පන්නල, පුහුල් හේන සහ බලත්ගමුව යන ගම්මාන වලින් සමන්විත වේ. මේ ගම් සම්ප්‍රදායික උඩරට ගම්මානයන් ලෙස සැලකිය හැකිය.[1] මේ ගම් කඳු බෑවුම්වල පිහිටි අතර, කුඹුරු යායවල් නිම්නයන්හි පිහිටියේය. කුඹුරු ඉඩම් වලින් බොහොමයක්ම හෙල් මළු ලියැදි වලින් සමන්විත වන අතර ඇතැම් විට ඒවා වර්ග යාර කිහිපයකට වඩා විශාල නොවේ.

මේ ගම්වල බොහෝ කොටස් වලට යා හැකි මාර්ග ඇත්තේ නැත. නමුත් ගොවි කාරක සභා කාර්යාලය, සමූපකාර සමිතිය සහ පාසැල මේ ගම් තුනටම මධ්‍යස්ථාන වූ තැනක පිහිටියේය.

ගමේ ආර්ථිකයේ හරය වන්නේ කෘෂිකර්මයයි. ප්‍රධාන භෝගය වී වෙයි. මේ ප්‍රදේශයේ විශාල ජන පීඩනයක් ඇත. ඉඩම් ඇත්තේ සීමාසහිත වශයෙන් නිසාත්, ගැහැණු ස්වල්ප දෙනෙකු විසින් ගෘහ කර්මාන්තයක් වශයෙන් කරන රෙදි විවීම හැරුනුවිට වෙනත් කිසිදු කර්මාන්තයක් නැති නිසාත් මුළු මහත් ජනතාවටම රැකියා සැපයීම සඳහා කෘෂිකර්මය පමණක් ප්‍රමාණවත් නොවේ. කෘෂිකර්මය යටතේ ඇති ඉඩම් කඩම් පුළුල් කිරීමට වුවද එතරම් අවකාශ නොමැත. පවුල් හිහ හතලිහක් පමණ දැනටමත් අම්පාර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල පිහිටි ගොවි ජනපදවල පදිංචිය සඳහා ගොස් ඇත. ගොවිතැන් වැඩ නැති කල වියලි කලාපයට වාරික ශ්‍රම සංචලනය වීම ද සිදු වේ.

ගොවි කාරක සභා ප්‍රදේශය තුල කුඹුරු අක්කර 212 ක් පමණ ඇති අතර ඒවා යල සහ මහ කන්න දෙකෙහිම වගා කෙරේ. අක්කර 1700 ක් පමණ වන ගොඩ ඉඩම් වලින් 1/2 ක් පමණ රබර් වගාවට යට වී ඇති අතර අනෙක්වා නොයෙකුත් අල වර්ග, සුළු අපනයන භෝග සහ පොල් යනාදිය වගා කරන ලද ගෙවතු වලින් යුක්ත වේ.

අස්වද්දන ලද සෑම කුඹුරු ඉඩමකටම වාගේ සුළු වාරිමාර්ග වලින් ජලය සැපයේ. වර්ෂයේ සෑම කාලයකම ජලය සැපයෙන දිය පාරවල් දෙකක් උපයෝගී කර ගැනීමෙන් මේ ප්‍රදේශයට ජලය සැපයීමට හැකි වී ඇති අතර, මේ නිසා කන්න දෙකම වගා කිරීමට ද පුළුවන් වී ඇත.

---

1. හෙල්මළු වී කුඹුරු සහ ඉන් ඔබ්බේ කඳු බෑවුම්වල පිහිටි ගෙවතු –කඳු මුදුන්වල හේන් – විවිධ කුලවල ජනයා
Ralph Pieris <u>Sinhalese Social Organisation</u>, Part II. The village - Chapter I, "Village Ecology" - Sarkar & Thambiah - <u>The Disintegrating Village.</u>

ලියා පදිංචි වූ ගොවීන් 182 ක් පමණ සිටින අතර, ඉන් 33% ක් අඳ ගොවීන්ය. අඳ ගොවීන් බිම් කුලිය වශයෙන් සම්ප්‍රදායිකව කෙරුණ අස්වැන්නෙන් 1/2 ක් ඉඩම් හිමියන්ට ගෙවනු ලැබේ. බොහෝවිට මේ භුක්ති සම්බන්ධතාවයන් ඇත්තේ ඥාතීන් සහ මිත්‍රයින් අතරය. එමනිසා එම සම්බන්ධතාවයන් අවධිමත් ස්වභාවයක් උසුලයි. ඉඩම් හිමි ගොවීන්ට ඇත්තේ ද කුඩා ඉඩම් කැබලිය. කුඹුරු හෝ ගොඩ ඉඩම් අක්කර 10 කට වඩා අයිති ඉඩම් හිමියන් කිසිවෙකුත් නැති තරම්ය.

ප්‍රදේශයේ ගොවීන් විසින් වගා කරන ලද කුඹුරු ඉඩම් කට්ටිවල වපසරිය ඉතා කුඩාය. ගොවීන්ගෙන් 50% ක් පමණ වගා කරන්නේ අක්කර එකකට වඩා කුඩා කුඹුරු ඉඩම් කැබලිය. ගොවීන්ගෙන් 20% ක් පමණ වගා කරන්නේ අක්කර 1/2 කට වඩා කුඩා කුඹුරු ඉඩම්ය. අක්කර දෙකකට වඩා වැඩියෙන් වගා කරන ගොවීන් සිටින්නේ 14% ක් පමණි. අඳ ගොවිතැන සහ ඉඩම් හිමය යම් යම් ගම්වලට හෝ ඇතැම් කුලවලට හෝ සීමා නොවේ.

ගොවීන් සියළු දෙනාම වාගේ වැඩි අස්වනු ලබා දෙන බී.ජී. 11-11, එච්.ඩී.66 වැනි වී වර්ගයන් වගා කරති. පැල සිටුවීම, පොහොර භාවිතය, වල් පැලෑටි සහ කෘමි නාශක භාවිතය ආදිය බහුලව සිදු වේ. එනමුත් නියම කාලයේදී සහ නියම ප්‍රමාණයන්ගෙන් පොහොර භාවිතා කළහොත් මීට වඩා අස්වැන්න වැඩි වෙතැයි කිව හැක. පැල සිටුවීම කන්න දෙකේදීම කරන අතර වල් නෙලීම සාමාන්‍යයෙන් අතින් කරනු ලැබේ.

බිම සැකසීම සඳහා මී හරකුන් සහ උදළු භාවිතා කෙරෙයි. ට්‍රැක්ටර් යොදා ගැනීම කෙරෙන්නේ කලාතුරකිනි. තරමක් විශාල කුඹුරු ඉඩම්වල පැල සිටවීමේදී අසල ගම්වල ගැහැණු උදව්ය කුලියට කැඳවා ගන්නා මුත් සාමාන්‍යයෙන් කුලී කරුවන් ගොවිතැන් කටයුතුවලට යොදා ගැනීම ඉතා අඩුය කෘෂිකාර්මික කටයුතු වලදී අත්තම් ක්‍රමය වැදගත් තැනක් ගනී.

මේ ගම් තුන නොයෙක් කුලවලට අයත් උඩරට සිංහලයන්ගෙන් සමන්විතය. මෙයින් විශාලම ගම වන කෙහෙල්පන්නල ප්‍රධාන වශයෙන් සිටින්නේ ගොවිගම් කුලයේ අයයි. ගමේ විවිධ කුල තිබීම නිසා ඇති විය හැකි ඇතැම් වෙනස්කම් නැති කිරීමෙහි ලා ගමේ වැඩි හිටියන් සමත් වී ඇති අතර, සමාජ එක්සත්කම සහ සහයෝගය ඇති වීම කෙරෙහි කුල භේදයෙන් එතරම් හානියක් සිදු වී නොමැත.

ගම්වැසියන් අතර සමාජ සහ ආර්ථික වශයෙන් එතරම් වෙනස්කම් නැති වීම ද තවත් වැදගත් සාධකයකි. ආර්ථික සහ සමාජයීය වශයෙන් බලගතු තත්වයක සිටින පවුල් නොමැති වීම නිසා පවුල් අතර කුලල් කා ගැනීම් මෙහි දක්නට නො ලැබේ. එසේම ගමෙහි එක්සත් කමට හා සංවර්ධනයට හානි වන ආකාරයකින් මොවුන් පක්ෂ දේශපාලනය කරන්නේද නැත. මේ සියළුම සාධක නිසා ගම තුළ යහපත් තත්වයක් උදා වී ඇත.

## ගොවි කාරක සභාවේ පසුබිම

මේ ප්‍රදේශයේ පළමුවන ගොවි කාරක සභාව තෝරා ගන්නා ලද්දේ 1958 දීය. වර්තමාන ගොවිකාරක සභාව 1968 දී තෝරා ගන්නා ලදි.

1 වන උප ග්‍රන්ථයෙන් පෙන්නුම් කෙරෙන පරිදි මේ ගොවි කාරක සභාව 1966 දක්වා හරිහැටි හෙඳින් ස්ථාවර වී නො පැවති බවත්, ඒ කාලයේ දී අක්කර බදු එකතු කිරීමටත්, වාරිමාර්ග පහසුකම් දියුණු කිරීමටත් එයට හැකියාවක් නොතිබුණ බවත් පෙනේ. 1966 සිට අක්කර බදු එකතු කිරීම ඉතා සාර්ථකව කෙරෙන අතර වාරිමාර්ග පහසුකම් සැපයීම සඳහා සෑහෙන මුදලක් ද වියදම් කර ඇත. වර්තමාන ගොවි කාරක සභාව 1968 න් පසුව ප්‍රදේශයේ කෘෂිකාර්මික දියුණුව ඇති කිරීම සඳහා නොයෙකුත් පියවරවල් ගන්නා ලදි.

ගොවිකාරක සභාවේ සාමාජිකයෝ සියල්ලම ගොවිතැන් කරන්නෝ වෙති. සමිතියේ සභාපති ගමේ පාසැල් උපගුරුවරයෙක් වන අතර ලේකම් සමුපකාර සභාවේ ද සභාපති වේ. මෙහි පාලක ලේකම් පලදාවර්ධන කමිටුවේ ද සාමාජිකයෙකි. ඔවුන් සියල්ලම පළාතේ ගොවීන් ඇළ දෙනාගේ කමිටුවෙන් ඇසුරු කරන ඔවුන් හා එකට වැඩ කරන පිළිගත් නායකයෝ වෙති.

මේ ප්‍රදේශයේ සිටින ගොවීන් ගොවි කාරක සභාවට තමන්ගේ සහයෝගය දෙන බව පහත සඳහන් සාධකයන්ගෙන් පැහැදිලිවේ:-

(අ) අක්කර බදු කල්වේලා ඇතිව ගෙවීම; (ආ) කන්න රැස්වීම් වලදී ගන්නා ලද තීරණයන්ටත්, වගා කාල සටහනටත් අනුකූලව කටයුතු කිරීම; (ඇ) වාරිමාර්ග නීති රීති හරිහැටි පිළි පැදීම; (ඈ) ශ්‍රමදාන වැඩවලට සහභාගිවීම.

නම් පුවරුවක්ද සහිත ස්ථාවර කාර්යාලයක් මේ ගොවිකාරක සභාවට තිබේ.(1) සාමාන්‍යයෙන් ගොවි කාරක සභා රැස්වීම් පවත්වන්නේ සෑම මාසයකම 3 වෙනිදාය. මේ රැස්වීම් වලට සාමාජිකයන්ගෙන් බොහෝ දෙනා පැමිණෙන බව පෙනේ. ගොවීන්ගේ දෛනික ගැටළු ගැන පමණක් නොව ගොවි පුහුණුව, ශ්‍රමදාන, ගොවීන්ට මුදලින් ආධාර කිරීම සහ ගොවි උපකරණ සැපයීම ආදී සාමාන්‍ය ප්‍රශ්න ගැනද මෙහිදී සාකච්ඡා වේ. මේ රැස්වීම් වල වාර්තා සවිස්තරව සහ නියම පිළිවෙලට තබාගෙන ඇත. සෑම රැස්වීම කටම සහභාගි වන සාමාජිකයන්ගේ      සහ අත්සන් ලබාගෙන ඒවා රැස්වීමේ වාර්තාවල අඩංගු කොට ඇත.

අවුරුද්දකට දෙවතාවක් ඒ ඒ කන්නය ආරම්භ වීමට ප්‍රථම කන්න රැස්වීම් පැවැත්වේ. මේ රැස්වීම් වලදී නියමිත කන්නයේ වී වගා සැළැස්මට අදාළ සෑම කෘෂිකාර්මික කටයුත්තක්ම සවිස්තරව සාකච්ඡා කරනු ලැබේ. ගොවීන්ගෙන් වැඩි කොටසක් මේ රැස්වීම් වලට සහභාගී වන අතර, ඒවාට පළාතේ කෘෂිකර්ම ව්‍යාප්ති සේවක මහතාට ද ආරාධනය කරනු ලැබේ. ප්‍රශ්න කරනු ලැබූ ගොවීන් 18 දෙනාගෙන් 14 දෙනෙක්ම, කන්න රැස්වීම් වලට හා සාකච්ඡා වලට සහභාගී වන බව පවසන ලදි.

---

1. සභාපති තුමාගේ ගෙදර ඉදිරිපස කාමරය මේ සඳහා කුලියට දී තිබේ. එය කේන්ද්‍රීය ස්ථානයක පිහිටා ඇති අතර සමුපකාර සමිතියට ද කිට්ටුය.

ඉඩමේ නම, වපසරිය, ගොවි කාරකයා, අයිතිකරු සහ ඉඩම් භුක්තියේ තත්වය අඩංගු වන කුඹුරු නාම ලේඛනය කුඹුරු පනතේ 35 වන වගන්තියට අනුකූලව නිවැරදිව පවත්වාගෙන යන අතර වාර්ෂිකව සංශෝධනය කරනු ලැබේ.

මෙම ගොවි කාරක සභාවේ මුදල් තත්වය ද ඉතා සතුටුදායකය. වාර්ෂිකව එකතු වන අක්කර බදු ප්‍රමාණය සාමාන්‍යයෙන් ගොවි කාරක සභාවට වාර්ෂිකව අය විය යුතු මුළු මුදල් ප්‍රමාණයට සමානය. (1 වන ඇමුණුම) දැනට ගොවි කාරක සභාවේ බැංකු ශේෂය රු. 6876.80 කි. (1973 දෙසැම්බර්)

ප්‍රදේශයේ ජල සම්පාදන කටයුතු දියුණු කිරීම අතින් මෙම ගොවි කාරක සභාවෙන් ඉමහත් සේවයක් සිදු වී ඇත. ජල සම්පාදනය සඳහා 1967 ට පෙර වැය කර ඇති මුළු මුදල් ප්‍රමාණය රු. 4000/- ට අඩුය. එහෙත් 1968 න් පසු ස්ථිර අමුණු හයක් සහ සැතපුම් 2 ක් පමණ දුරට විහිදෙන කොන්ක්‍රීට් ජල මාර්ග ගොඩ නැගීම සඳහා රුපියල් 60,000/-[1] ක පමණ මුදල් වැය කර ඇත. මේ ජල පහසුකම් නිසා මෙම ප්‍රදේශයේ කුඹුරු සෑම වර්ෂයකම දෙවතාවක් සාර්ථකව ගොවිතැන් කිරීමට හැකි වී ඇත.

දැනට ගොවි කාරක සභාවේ මෙහෙයවීමෙන් සැතපුම් 3 ක් පමණ විහිදෙන පාරක් ද ශ්‍රමදානයෙන් කපාගෙන යනු ලැබේ. ප්‍රදේශය කඳු සහිත දුෂ්කර එකක් නිසා මෙය වුවද සැලකිය යුතු කාර්යයකි. මේ හැරුණුවිට ගොවි කාරක සභාව එහි අරමුදල් යොදා ඇල වේලි වැනි දේවල් ප්‍රතිසංස්කරණය කිරීම හා නඩත්තු කිරීම් ද කරයි. මෙවැනි වැඩ සඳහා වරකට රු. 50/- කට නොවැඩි මුදලක් වැය කරනු ලබන අතර, එවැනි නඩත්තු කිරීමේ කටයුතු සඳහා දැනට රු. 3000/- ක පමණ මුදලක් වියදම් කොට ඇත.

මෙම ගොවි කාරක සභාවෙන් පලාතේ ගොවීන්ගේ අවශ්‍යතාවයන් ගණනාවක්ම සපුරා දෙනු ලැබේ. පොහොර, වගා ණය යනාදිය සමූපකාරය මාර්ගයෙන් ලබා දීමට ද සමූපකාරය මගින් සහතික මිල ක්‍රමය යටතේ වී මිළදී ගැනීමට ද කටයුතු සලස්වා තිබේ. අවශ්‍ය බිත්තර වී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති සේවාවන් මගින් සපයන අතර ගොවීන්ගේ ප්‍රයෝජනය සඳහා කුලියට දීමට බෙහෙත් ඉසින යන්ත්‍රයක් ද ගොවි කාරක සභාවට ඇත.

කන්න රැස්වීමේදී ඇල වේලි ශුද්ධ කිරීම සඳහා දිනයන් නියම කර ගනු ලබන අතර එහිදී ගනු ලබන තීරණ නියම ආකාරයට ක්‍රියාත්මක කරනු ලැබේ. නියමිත වේලාවට ඇල වේලි ශුද්ධ කිරීමට යම් ගොවියෙකුට නොහැකි අවස්ථාවලදී එම කාර්යය ගොවි කාරක සභාවෙන් කරවා ඒ සඳහා යන වියදම් එම තැනැත්තාගෙන් අය කරගනු ලැබේ.

---

1. රජයෙන් ලබා ගත් මුදලින් කෙරුන කොන්ත්‍රාත් වැඩ.

ජලය බෙදා හැරීමද ගොවි කාරක සභාවෙන් පාලනය කෙරේ. ජලය හිඟ අවස්ථාවලදී ගොවි මහතුන් සමඟ සාකච්ඡා කොට යායේ එක් එක් කොටස් සඳහා වරින් වර ජලය බෙදා හරිනු ලැබේ. මෙය ග්‍රාම සේවක විසින් තදින් ක්‍රියාත්මක කරනු ලැබේ. ගොවි කාරක සභාවක වගකීම විසිර තිබීම නිසා ජල පාලනය දුර්වල වන බවත් අමුණු සහ ඇලවල් ශුද්ධ කිරීම සහ නඩත්තු කිරීම අඩපණ වන බවත් මේ ගොවි කාරක සභාව සම්බන්ධයෙන් කිසිවකුට කිව නොහැක. ඇත්ත වශයෙන් එයින් පෙන්වනු ලබන්නේ ගොවි කාරක සභාවකට මේ කාර්යයන් කාර්යක්ෂම ලෙස කිරීමට හැකියාවක් තිබෙන බවයි.

වැපිරීමේ සහ පැල සිටුවීමේ දිනයන් ද කන්න රැස්වීමේදී තීරණය කරනු ලබන අතර හැකි තරම් දුරට සෑම යායකම එකම වී වර්ගයක් වගා කිරීමට ද තීරණය කරනු ලැබේ.

වාරිමාර්ග නඩත්තු කිරීම, ජලය බෙදා හැරීම, පාරවල් සෑදීම යනාදී සංවර්ධන වැඩ සඳහා ප්‍රදේශයේ ගොවීන්ගේ සම්පූර්ණ සහයෝගය ලබා ගැනීමට මෙම ගොවි කාරක සභාව සමත් වී ඇත. අප විසින් සම්මුඛ සාකච්ඡා කරන ලද සෑම ගොවියෙක්ම ශ්‍රමදාන කටයුතුවලට සහභාගී වෙයි.

අළුත් ගොවිතැන් ක්‍රම ගැන ගොවීන්ට අවබෝධයක් ලබා දීමට මේ ගොවි කාරක සභාව උත්සාහයක් ගනී. එය මගින් ගොවි පුහුණුවීමේ පන්ති ගණනාවක් සංවිධානය කොට ඇති අතර, කන්න රැස්වීම්වලදී කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් සමඟ සාකච්ඡා කිරීමට ද ගොවීන්ට අවස්ථාව ලබා දී ඇත.

අප විසින් සම්මුඛ සාකච්ඡා කළ ගොවීන්ගෙන් වැඩි දෙනෙක් ගොවි කාරක සභාවේ නිලධාරීන් හොඳින් හඳුනති. ප්‍රශ්න කරනු ලැබූ ගොවීන් 18 දෙනාගෙන් 13 දෙනෙක්ම ප්‍රධාන නිලධාරීන් (සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික) හොඳින් හඳුනන අතර ඉතිරි 5 දෙනාගෙන් 4 දෙනෙක් නිලධාරීන්ගෙන් 2 ක් හෝ අඩු වශයෙන් එක් අයෙකුවත් හොඳින් හඳුනන අය වූහ.

ගොවි කාරක සභාව ඉතා හොඳ වැඩ කොටසක් කරනු ලබන බවත් ගමේ කටයුතු ගැන උනන්දුවකින් ක්‍රියා කරන බවත් ගොවීහු අවිවාදයෙන්ම පිළි ගනිති. ගොවි කාරක සභාවේ අවංකකම ගැන ඔවුන් හැම දෙනාම සම්පූර්ණ විශ්වාසය තබති. කිසි ගොවියෙකු විසින් සමිතියේ වැඩ දෝෂ දර්ශනයට භාජන නොකළ අතර සුළු වාරිමාර්ග පහසුකම් දියුණු කිරීම, වගා කාල සටහන ක්‍රියාත්මක කිරීම, පොහොර, බීත්තර වී ආදිය ලබා දීම සහ ශ්‍රමදාන කටයුතු සංවිධානය කිරීම යනාදී කටයුතු ගැන ගොවි කාරක සභාව කෙරෙහි ප්‍රසාදය පළ කළහ.

1972-73 වගා සැලැස්ම සකස් කිරීම

ක්‍රියාත්මක වැඩ පිළිවෙල සකස් කිරීම බොහෝ දුරට කායසීලීය නියෝගයන්ටත්, මග පෙන්වීම් වලටත් අනුව කරන ලදී. මේ සැලැස්ම ගැන සාකච්ජා කිරීම සඳහා ගොවි කාරක සභාව පලාතේ ක්‍රියාත්මක නිලධාරියා වන ග්‍රාම සේවක ද සමුපකාර සමිතියේ කළමනාකරු ද සමඟ 1972 මැයි මස රැස්වීමක් පැවැත්වූහ. ඉදිරි වසර සඳහා ඉලක්කයන් තීරණය කිරීමට පෙර සෑම කාරනයක්ම සාකච්ජාවට භාජන කළ බව මේ රැස්වීමේ වාර්තාවෙන් පෙනේ. පහත සඳහන් කරුණු ගැන එහිදී සාකච්ජා කරන ලදී:-

(අ) වගා කිරීමට ඇති කුඹුරු ප්‍රමාණය.

කන්න දෙකේදීම වගා කිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද කුඹුරු ප්‍රමාණය අක්කර 212 කි. කුඹුරු වලින් 95% කට විශ්වාසදායක වාරි ජල පහසුකම් ඇති බැවින් මෙය නිගමනය කිරීම අපහසු නොවේ.

(ආ) දියුණු කරන ලද වී වර්ග වගා කිරීම.

කලින් කන්නයේ දී බී.පී.11-11 වගා කරන ලද්දේ අක්කර 2 ක් පමණක් වන නමුත් පසු කන්න දෙකේදීම මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණයේම මේ වර්ගය වගා කිරීමට තීරණය කර ගන්නා ලදී. කමිටුවේ කැමැත්ත අනුව ක්‍රියාත්මක නිලධාරී විසින් මෙම තීරණය ගනු ලැබූ අතර එම තීරණය ගොවීන්ට දන්වනු ලැබුවේ ඔක්තෝබර් මාසයේදී පවත්වන ලද කන්න රැස්වීමේදී පමණකි. මෙවැනි තීරණයක් ගැනීම ඇතැම් තත්වයන් යටතේ යෝග්‍ය වන නමුදු ගොවීන්ගේ අදහස් නො විමසා එසේ කිරීම කිසිසේත් සාධාරන නැත.

(ඇ) පොහොර භාවිතය.

අවශ්‍ය වන පොහොර ප්‍රමාණය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව තීරණය කරනු ලැබීය. අනෙක් සියලුම සාධකයන් පොහොර භාවිතයට සුදුසු ආකාරයකින් පවත්නා නිසා මෙසේ කිරීම යෝග්‍යය. පළාතේ බෙහෙවින් ප්‍රයෝජනයට ගන්නා එසේම නිර්දේශ කර ඇති පොහොර වර්ගයක් වන යූරියා පිළිබඳව සැලැස්මේ කිසිවක් සඳහන් නැත. /1972/73 අවුරුද්දේ ඇස්තමේන්තු කරන ලද පොහොර ප්‍රමාණය 1971/72 අවුරුද්දේ එසේ කරන ලද ප්‍රමාණයට සමාන විය.

(ඈ) පැල සිටවීම.

අවුරුදු පතා කන්න දේකේම මුළු කුඹුරු ප්‍රමාණයේම පැල සිටුවීම කරනු ලැබේ. පැල සිටුවන කුඹුරු අක්කර ප්‍රමාණය සෑම වසරකම ස්ථාවරව පවතින නිසා එය ඇස්තමේන්තු කිරීම පිළිබඳව ප්‍රශ්නයක් නැත.

(ඉ) ණය.

බිම පිළියෙල කිරීම, බිත්තර වී, පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය හා පැල සිටුවීම වෙනුවෙන් අවශ්‍ය වන ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් ඇස්තමේන්තු කර ඇත. (උප ග්‍රන්ථය 2) එහෙත් තම තමන්ගේ ණය අවශ්‍යතාවයන් පිළිබඳව ගොවීන්ගෙන් විමසා නොමැත. ආයතනික ණය බහුලව ප්‍රයෝජනයට නො ගන්නා ප්‍රදේශයක ගොවි ,කාරක සභාව තනිව මෙවැනි තීරණයක් ගැනීම අසතුටුදායකය.

(ඊ) වල් නාශකයන් පිළිබඳ අවශ්‍යතාවයන්.

විශ්වාසදායක ජල සැපයුමක් යටතේ, පැල සිටවන කුඹුරුවල වල් පැළෑටි තදබල ප්‍රශ්නයක් නොවේ. වල් පැළෑටි මර්ධනය සඳහා රසායනික ද්‍රව්‍ය අවශ්‍ය යයි නිගමනය කර ඇත්තේ අක්කර 12 කට පමණි.

(උ) කෘමි නාශකයන් පිළිබඳ අවශ්‍යතාවයන්.

කෘමි නාශක අවශ්‍යතාවයන් ක්‍රියාත්මක වැඩ සටහනෙහි දක්වා නැත. ගොවීන්ගෙන් වැඩි දෙනෙක් කෘමි නාශක ප්‍රයෝජනයට ගන්නා බැවින් මෙය බලවත් අඩුපාඩුවක් ලෙස සැලකිය හැක.

(ඌ) වගා වැඩ සටහන.

මෙය කන්නය පටන් ගැනීමට මාස 5 කට පෙර සකස් කරන දළ සැලැස්මකි. වගා වැඩ සටහන කන්නයේ ගොවිතැන් කටයුතු පටන් ගැනීමට පෙර පවත්වන කන්න රැස්වීමේදී සාකච්ඡා කරන බැවින්, මෙවැනි දළ සටහනක් මේ කටයුත්තට සෑහේ. කෙසේ වුවත් ජල සැපයුම අනුව මෙම සැලැස්ම වෙනස් කිරීමට අවශ්‍ය වේ.

(එ) උපකරණ.

ගොවීන්ගේ අවශ්‍යතාවයන් ගැන සලකා බලා උදලු 225 ක් අවශ්‍ය වෙතැයි ඇස්තමේන්තු කර ඇත.

(ඒ) බලාපොරොත්තු වන අස්වැන්න.

මහ හා යල කන්නවල බලාපොරොත්තු වන අස්වැන්න අක්කරයට බුසල් 60 කි. මෙය පසුගිය කන්න දෙකේ ඇස්තමේන්තුවලට වඩා බුසල් දහයකින් වැඩිය. එක් කන්නයක් තුල බුසල් 10 ක වැඩිවීමක් අපේක්ෂා කිරීම තරමක් අපහසු වුවත්, ප්‍රයෝජනයට ගැනීමට බලාපොරොත්තු වන වී වර්ග, පොහොර හා අනෙක් යෙදවුම් ගැ න බලනවිට මෙවැනි වැඩිවීමක් කෙරෙහි බලාපොරොත්තු තැබිය හැක.

22905

(ඔ) සහතික මිල ක්‍රමය යටතේ වී විකිණීම.

විකිණීමට බලාපොරොත්තු වන වී ප්‍රමාණය ගැන 1972/73 ක්‍රියාත්මක වැඩ සටහනෙහි සඳහන් වී නැත. විකිණීමට ඇති ප්‍රමාණය සාමාන්‍යයෙන් නිගමනය කරන්නේ අක්කරයට බුසල් 15 බැගිනි. ගොවිකාරක සභා ප්‍රදේශය තුල එක් අයෙක් විසින් වගා කරන සාමාන්‍ය කුඹුරු ප්‍රමාණය අක්කර 1.16 බැවින්, විකිණීමට ඇති අතිරික්ත ප්‍රමාණය නිෂ්පාදනයෙන් 1/4 සැටියට (බුසල් 15) නිගමනය කිරීමේ වැරැද්දක් නොමැත.

අතිරේක ආහාර භෝග, පලතුරු සහ සුළු අපනයන භෝග, ගොඩ ගොවිතැන් වශයෙන් සැලකේ. මෙහිදී ඇස්තමේන්තු සාදනු ලබන්නේ රෝපන ද්‍රව්‍ය සහ ගොවිතැන් කිරීමට බලාපොරොත්තු වන අක්කර ප්‍රමාණයත් ගස් ගණනත් පිළිබඳව පමණි. ගොඩ බිම් පිළිබඳ ක්‍රියාත්මක වැඩ පිළිවෙලේ ඇති යෝජනාවත් හුදු අනුමානයන් පමණක් බව කරුණු කීපයක් නිසා කිව හැක. ගොඩ ගොවිතැන පිළිබඳව ගොවි කාරක සභාව එතරම් උනන්දුවක් නොගැනීමත්,(1) සාමාන්‍යයෙන් ගොඩ ගොවිතැන එතරම් ක්‍රමානුකූල ආකාරයකින් සිදු නොවීමත් මේවාය.(2) ඇත්තෙන්ම ක්‍රියාත්මක වැඩ පිළිවෙලේ ගොඩ ගොවිතැනට හිමි වන්නේ ඉතාමත්ම නො වැදගත් තැනකි. සත්ව පාලනය සම්බන්ධයෙන් ද මේ තත්වයම පවතී. සත්ව පාලනය හා ගොඩ භෝග පිළිබඳව ගොවීන් හා සාකච්ඡා නොකර ඉලක්ක තීරණය කිරීමට ගොවි කාරක සභාවට පුළුවන්කමක් නැත්තේ වී ගොවිතැන මෙන් නොව මේ අංශ දෙක බොහෝ දුරට පෞද්ගලික ස්වරූපයක් ගන්නා නිසයි. මේ නිසා සත්ව පාලනය හා ගොඩ භෝග පිළිබඳව දී ඇති ඇස්තමේන්තු සාධාරන ඒවා ලෙස සැලකිය නොහැක.

සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

සැලසුම් කිරීමේ ඊළඟ පියවර ක්‍රියාත්මක කිරීමයි. එසේම එය තමා ඉතාම වැදගත් කොටස ලෙස සැලකිය හැක්කේ. සියලුම ආයතන, රජයේ නිලධාරීන්, ග්‍රාමීය ආයතනවල නිලධාරීන් සහ ඒ සැමටම වඩා ගොවීන්ගේ සහභාගිත්වයත් සම්බන්ධීකරණයත් අවශ්‍ය වන්නේ මෙම අවස්ථාවේදීය. මේ සෑම මට්ටමක් අතරම නිරන්තරයෙන් අදහස් හුවමාරුවීම, ඕනෑම සංවර්ධන සැලැස්මක් සාර්ථකව ක්‍රියාත්මක වීමෙහි ලා පූර්ව අවශ්‍යතාවයන් වේ.

කෙහේල්පන්නල ගොවි කාරක සභාව ගැන සළකා බැලීමේදී ගොවි කාරක සභාව සහ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේ යෙදී සිටින නියෝජිතයන් අතර ඉතා කිට්ටුවෙන් ක්‍රියා කිරීමක් නොතිබීන. වැඩ පිළිවෙල දිස්ත්‍රික්ක මට්ටමට පැමිණිවිට එය පිළි ගත්තාද, ප්‍රතික්ෂේප කළාද, එසේ නැතහොත් වෙනස් කළාද යන බව කොමිටිය හෝ ක්‍රියාත්මක කිරීමේ නිලධාරියා දැන සිටියේ නැ ත. සැලැස්මේ ඇති ඉලක්කයන් ගැන කන්න රැස්වීම් වලදී පවා සාකච්ඡා වූයේ

---

1. උස්බිම් පිළිබඳ තොරතුරු කිසිවක් ගොවි කාරක සභා සතුව නැත.
2. කුඹුරු පනත යටතේ උස් බිම් කෙරෙහි බලපෑමට ගොවි කාරක සභාවලට බලයක් දී නොමැත.

නැත. මේ අනුව ක්‍රියාත්මක වැඩ පිළිවෙල සකස් කොට රට ඉහළ මට්ටමට **යැවූ** පසු රට කුමක් වේදැයි ගොවි කාරක සභාව දන්නේ නැත.

සමහරවිට මෙම ක්‍රියාත්මක වැඩ පිළිවෙලෙහි වඩාත්ම වැදගත් අංශය වන්නේ එය ක්‍රියාත්මක කරනු ලබන ගොවීන් ඒවාට සහභාගී කරවා ගන්නේ කෙසේද යන්නයි. ඔවුන් මේ වැඩ පිළිවෙලට සහභාගී වන තරම, රඳා පවත්නේ ඔවුන් ඒ ගැන කොතෙක් දුර දන්නේ ද යන්න මතත් එය සකස් කිරීමේදී ඔවුන් සහභාගී වන ප්‍රමාණය මතත්ය. සම්මුඛ සාකච්ඡා කරනු ලැබූ ගොවීන් 18 දෙනාගෙන් 14 දෙනෙකුම මේ වැඩ පිළිවෙල ගැන කිසිවක් නො දැන සිටියේය. මේ වැඩ පිළිවෙල ගැන දැන සිටි 4 දෙනාගෙන් දෙන්නෙක්ම ගොවි කාරක සභාවේ කාරක සභිකයන්ය. වැඩ පිළිවෙල සකස් කිරීමේදී ගොවීන් සහභාගී කරවා නො ගැනීම නිසා එය ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන් තුළ ඇති බැඳීම අඩු කරවීමට හේතු වෙයි. මේ වැඩ පිළිවෙල සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීම කුමක්ද, එය ක්‍රියාත්මක කිරීමේදී මතු විය හැකි ගැටළු මොනවාද, එය ක්‍රියාත්මක කිරීමේදී කළ යුතු අනුවර්තනයන් මොනවාද යන්න ගැන ඔවුන්ට දන්වා තිබුණේ නැත.

ක්‍රියාත්මක වැඩ පිළිවෙල සහ කන්න දෙකේදීම කර ඇති වැඩ ගැන සළකනවිට ඇතැම් ඉලක්කයන් ලබාගෙන නොමැති බව පෙනී යයි. වඩාත්ම අඩුවෙන් ක්‍රියාත්මක වී තිබුනේ ගොඩ ඉඩම් සහ පශු පාලනය සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබුණු වැඩ පිළිවෙලවල්ය. මෙයට හේතු වූ කරුණු වූයේ අවශ්‍ය රෝපන ද්‍රව්‍ය සහ සතුන් ලබා ගැනීමට නොහැකි වීමත් සහ විශේෂයෙන් පශු පාලනය වැනි වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කිරීමට ගොවීන් එතරම් කැමැත්තක් නොදැක්වීමත්ය. ගොවීන්ට ලබා දීමට බලාපොරොත්තු වූ ණය මුදල් ප්‍රමාණයන් ද හරිහැටි ලබා දීමට නොහැකි විය. උදා, කටු කම්බි යනාදිය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ වැඩ පිළිවෙලවල් ද හරිහැටි ක්‍රියාත්මක නොවීය.

මේ වැඩ පිළිවෙල සකස් කිරීමේදී ගොවීන්ගේ සහ යෙදවුම් සපයනු ලබන ආයතනවල අදහස් විමසුවා නම් සහ ක්‍රියාත්මක කිරීමේදී විවිධ මට්ටම් වලදී ඔවුන් සමඟ නිතර සාකච්ඡා කළා නම් ඉහත දැක්වූ ප්‍රශ්න වලින් සමහරක්වත් විසඳා ගැනීමට ඉඩ තිබුණි.

කෙසේ වුවද වී නිෂ්පාදන වැඩ පිළිවෙල ගැන සළකනවිට යම් සාර්ථකත්වයක් ලැබූ බව පෙනේ. වැඩි දියුණු කරන ලද වී වර්ග වගා කිරීම සම්බන්ධයෙන් ඉතා ඉහළ ඉලක්කයන් තීරණය කර ගන්නා ලද නමුදු සාර්ථක අන්දමින් ඒ ඉලක්ක කිට්ටුවට පැමිණි බව කිව හැක. 1972/73 මහ කන්නයේදී සහ 1973 යල කන්නයේදී වගා කල වී වර්ග පිළිබඳ තත්වය පහත සඳහන් ලේඛනයෙන් පැහැදිලි වේ.

ලේඛන අංක 1

| වගා කරන ලද වී වර්ග | වගා කළ ගොවීන් ගණන මහ 72/73 | යල 1973 |
|---|---|---|
| බී.ජී. 11-11 | 8 | 15 |
| වෙනත් දියුණු කරන ලද වී වර්ග | 1 | 2 |
| එච්. වර්ගයන් | 6 | 1 |
| සම්ප්‍රදායික වර්ගයන් | 3 | 0 |
| එකතුව | 18 | 18 |

මේ කන්න දෙකේදී කරන ලද පොහොර භාවිතය ද කරන ලද ඇස්තමේන්තු කිට්ටුවටම පැවතියේය. පොහොර භාවිතා කිරීමේ ඉලක්ක සකසන ලද්දේ අක්කරයකට හොන්ඩර 2 1/2 ක් වන පරිද්දෙනි.

සම්මුඛ සාකච්ඡා කරන ලද ගොවීන් 18 දෙනා විසින් පොහොර භාවිතා කරන ලද මට්ටම මහ කන්නයේදී අක්කරයට හොන්ඩර 2.26 ක් වූ අතර යල කන්නයේදී අක්කරයකට හො. 2.52 ක් විය. වී. 2, ටී.ඩී.එම්, යූරියා, ඇමෝනියම් සල්පේට් යන පොහොර වර්ග මීට ඇතුළත් වේ. මේ ප්‍රදේශයට ඒ ඒ වර්ගවල පොහොර නිර්දේශ කර ඇත්තේ පහත සඳහන් ආකාරයෙනි. වී 2 හොන්ඩර 1 සිට 1 1/2 දක්වා ද, ටී.ඩී.එම්. හොන්ඩර 1 ද සහ යූරියා හොන්ඩර 1/2 සිට 3/4 දක්වා. මේ අනුව අක්කරයකට යෙදිය යුතු සාමාන්‍ය පොහොර ප්‍රමාණය හොන්ඩර 2 1/2 සිට 3 1/4 දක්වා වේ. එනිසා යොදවනු ලැබූ සාමාන්‍ය පොහොර ප්‍රමාණය නිර්දේශිත ප්‍රමාණයන්ට වඩා එතරම් පහත් මට්ටමක පැවතියේ නැත.

ගොවීන් 15 දෙනෙකු සම්බන්ධයෙන් ඔවුන් මහ සහ යල කන්නවල ලබා ගත් අස්වැන්න පිළිබඳව තොරතුරු එකතු කරනු ලැබීය. 1972/73 මහ කන්නය සඳහා සහ 1973 යල කන්නය සඳහා අක්කරයකට ලබා ගත් සාමාන්‍ය අස්වැන්න ප්‍රමාණය පිළිවෙලින් බුසල් 51.9 ක් සහ 54.5 ක් වේ. මෙය ඊට කලින් කන්න දෙකේ ලබා ගත් අස්වැන්නට වඩා සැහෙන්නට ඉහළය. (කලින් කන්නවල සාමාන්‍ය අස්වැන්න ලෙස ක්‍රියාත්මක වැඩ පිළිවෙලෙහි දක්වා ඇත්තේ අක්කරයට බුසල් 50 කි) නමුත් මේ අස්වැන්න වර්තමාන අවුරුද්දේ අස්වැන්න සඳහා කර ඇති ඇස්තමේන්තුවලට වඩා පහත්ය. (අක්කරයට බුසල් 60) නමුත් ගොවීන්ගෙන් වෙන වෙනම ලබා ගත් අස්වනු පිළිබඳ තොරතුරු ගැන සළකන විට ඔවුන්ගෙන් සැහෙන ප්‍රමාණයක් (මහ කන්නයේ 40% සහ යල කන්නයේ 47%) අක්කරයට බුසල් 60 ට වඩා ලබා ඇති බව පෙනේ.(1)

---

1. සමහර උත්තරකරුවන් විසින් දක්වන ලද අස්වැන්න ප්‍රමාණයන් අඩුවෙන් සඳහන් කර ඇති බව ගොවි කාරක සභාවේ සභාපතිතුමා විසින් දන්වන ලදී.


ලේඛන අංක 2

ගොවීන් අක්කරයට ලබා ගත් අස්වැන්න පිළිබඳ විස්තර

| අක්කරයට ලබා ගත් වී බුසල් ගණන | ගොවීන් ගණන | |
|---|---|---|
| | මහ | යල |
| අක්කරයකට බුසල් 30 ට අඩුවෙන් | 2 | 3 |
| අක්කරයකට බුසල් 30–60 අතර | 7 | 5 |
| අක්කරයකට බුසල් 60 ට වැඩි | 6 | 7 |
| එකතුව : | 15 | 15 |

කෙළෙල්පන්නල ගොවි කාරක සභාවේ 1972/73 ක්‍රියාත්මක වැඩ පිළිවෙල බොහෝදුරට සකස් කරන ලද්දේ ඒ සඳහා **සපයන** ලද මග පෙන්වීම අනුවය. නමුත් බොහෝ ඉලක්කයන් තීරණය කිරීමේදී ගොවීන් සමග හෝ යෙදවුම් සැපයෙන ආයතන සමග සාකච්ඡා නොකළ නිසා එම ඉලක්කයන් අස්වාභාවික එවා බවට පත් විය. මෙම කරුණට අමතරව ගොවි කාරක සභාව සහ යෙදවුම් සැපයීම සඳහා පවත්නා ආයතන අතරත් ප්‍රාදේශීය මට්ටමේදී සහ දිස්ත්‍රික්ක මට්ටමේදී ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරෙන ආයතනත් අතර අඳගසු හුව මාරුව සහ සමායෝජනය අඩු වීමත් නිසා ක්‍රියාත්මක කිරීමේ අවධිය වැඩ පිළිවෙලෙහි වඩාත්ම අසාර්ථක කොටස බවට පත් වුවා යැයි කිව හැක.

අළුත්නුවර ගොවි කාරක සභා ප්‍රදේශය



## 3. අළුත්නුවර ගොවි කාරක සභාව

ගොවි කාරක සහා ප්‍රදේශය පිළිබඳ පසුබිම.

අළුත්නුවර ගොවි කාරක සහා ප්‍රදේශය මාවනැල්ල නගරයේ සිට සැතපුම් 4 ක් පමණ ඈතින් පිහිටියේය. එය අළුත්නුවර, අයගම සහ උඩුගල යන ගම් තුනකින් සමන්විතය. මේ ප්‍රදේශය කෙහෙල්පන්නල ප්‍රදේශය තරම් කඳු සහිත නොවන අතර හෙල්මලු ක්‍රමයට සෑදූ කුඹුරු දක්නට නො ලැබේ. මේ ගම් තුනේ වඩාත් නො දියුණු කොටස් හැරුණුවිට අනික් සියළුම ප්‍රදේශවලට මෝටර් රථ වලින් යා හැකි මාර්ග ඇත. ඓතිහාසික වැදගත් කමින් යුක්ත අළුත්නුවර දේවාලය වටා මේ ප්‍රදේශයේ සම්පූර්ණ සමාජ–ආර්ථික රටාව ගෙතී ඇති බව පෙනේ.

මේ ප්‍රදේශයේ ආර්ථිකය තුළ කෘෂිකර්මය ප්‍රධාන ස්ථානයක් ගන්නා අතර වී ගොවිතැන ගොවීන්ගේ මූලික කෘෂිකාර්මික කටයුත්ත වේ. සුළු වශයෙන් ගෘහවල කෙරෙන රෙදි විවීම සහ බීඩි නිෂ්පාදනය හැරුණුවිට වෙන කිසිදු කර්මාන්තයක් නොමැත. මේ ප්‍රදේශවල තදබල ජන පීඩනයක් දක්නට ලැ බේ.

රබර්, පොල්, කෙසෙල්, අල වර්ග, ගම්මිරිස් යනාදී සුළු භෝග වර්ග ගොඩ ඉඩම්වල ගෙවතු වගාවන් ලෙස වගා කෙරේ. විශාල ප්‍රමාණයේ පොල් සහ රබර් ඉඩම් (අක්කර 10 –25 දක්වා) ඇත්තේ ස්වල්පයක් පමණකි. අක්කර 250 ක් පමණ වූ සම්පූර්ණ කුඹුරු ඉඩම් ප්‍රමාණයම වගා කෙරෙනුයේ අහස් දියෙනි. සාර්ථක සුළු වාරිමාර්ග ක්‍රමයක් තවම දියුණු කොට නොමැත. විශාල ගංගා නොමැති අතර ඒවා හරස් කොට ජලය ලබා ගැනීමට වුවද ඉඩ කඩ නොමැත. අතීතයේදී මේ ප්‍රදේශයේ විශාල කුඹුරු යායවලට දිය සපයන ලද කුඩා වැව් තිබුණ නමුත් අද ඒවා කුඹුරු ඉඩම් බවට හරවා ඇත.

මේ ප්‍රදේශයේ ඉඩම් අයිතිය සහ භුක්තිය වැඩවසම් සම්බන්ධතාවයන් අනුව බොහෝදුරට තීරණය වී තිබේ. ඉඩම් වලින් බොහොමයක් එක්කෝ පන්සලට එසේ නැත්නම් දේවාලයට අයත් වූ අතර ඒවා වගා කරනු ලබන්නේ රාජකාරී ක්‍රමය යටතේය.(1) මේ ඉඩම් වගා කරන්නන් එක්කෝ දේවාලයට හෝ පන්සලට කිසියම් සේවාවක් කළ යුතු අතර එසේ නැත්නම් එම සේවාවන් වෙනුවට කිසියම් නිශ්චිත මුදල් ගෙවනු ලබයි. මෙවැනි සමහර වැඩවසම් ඉඩම් වගා කරන අයට ඒ ඉඩම් සම්බන්ධයෙන් ස්ථාවර සහ පාරම්පරික අයිතියක් ඇත. කෙසේ වුවද ගොවීන්ගෙන් වැඩි දෙනෙක් ඉඩම් හිමි ගොවියන් සහ අඳ ගොවියන් වේ. 41% ක් පමණ අඳ ගොවීන් විය.(2) මේ ප්‍රදේශයේ එක ගොවියෙකු

1. Ralph Peiris, Sinhales Social Organisation. බලන්න.
2. ගොවි කාරක සභාව විසින් ගොවීන් පිළිබඳ නාම ලේඛනය හරිහැටි පවත්වා ගෙන ගියේ නැති නිසා මේ පිළිබඳ සත්‍ය තොරතුරු සපයා ගැනීමට නොහැකි විය. පන්සල් සහ දේවාල ඉඩම් වගා කරනු ලබන එසේම ඒ සඳහා රාජකාරී කරනු ලබන ගොවීන් අඳ ගොවියන් ලෙස ලියාපදිංචි කොට නොමැත.

විසින් වගා කරන සාමාන්‍ය ඉඩම් ප්‍රමාණය කුඩාය. ගොවීන්ගෙන් 58% ක් පමණ ගොවිතැන් කරන්නේ අක්කර 1/2 කට අඩු කුඹුරු ඉඩම් ප්‍රමාණයකි. 13% ක් පමණ ගොවිතැන් කරන්නේ අක්කර එකකට වඩා අඩු කුඹුරු ඉඩම් ප්‍රමාණයකි. කුඹුරු අක්කර 2 ට වැඩියෙන් වගා කරන්නේ 3% පමණකි.

මේ ප්‍රදේශයේ ද සාමාන්‍යයෙන් කන්න දෙකේදීම වී වගා කෙරේ. නමුත් යල කන්නයේදී ජලය හිඟකම නිසා කුඹුරු ඉඩම්වල සැලකිය යුතු ප්‍රමාණයක එළවළු ආදිය වගා කෙරෙයි. බොහෝවිට කුඹුරු වැඩ සඳහා මී හරකුන් සහ උදලු උපයෝගී කර ගනු ලබන නමුත් බිම් සැකසීම සඳහා ස්වල්ප වශයෙන් ට්‍රැක්ටර් ද උපයෝගී කර ගනු ලැබේ. මහ කන්නයේදී කුඹුරු ඉඩම් වලින් වැඩි කොටසක පැල සිටුවීම කෙරෙන අතර යල කන්නයේදී ජලය හිඟකම නිසා එසේ කෙරෙන්නේ කුඹුරු ඉඩම් ස්වල්පයක පමණි. බොහෝ ගොවීන් විසින් පෝර භාවිතා කරන නමුත් ජල සැපයුම නිසැක නොවන නිසා නිර්දේශිත පොහොර ප්‍රමාණය යෙදීමට බොහෝ ගොවීන් මැලි වෙති. වල් පැළෑටි ඉදිරීම අතින් කෙරෙන අතර කෘමීන්ගෙන් සහ ලෙඩ රෝග වලින් කුඹුරු ඉඩම් රැක ගැනීම සඳහා රසායනික ද්‍රව්‍යයන් ද යොදා ගනු ලැබේ.

අළුත්නුවර ගොවි කාරක සභා ප්‍රදේශයේ සමාජ ව්‍යුහය මඳක් සංකීර්ණය. මුස්ලිම් ජාතිකයින් සැලකිය යුතු සංඛ්‍යාවක් මෙහි සිටින අතර සිංහලයන් වුවද විවිධ කුලවලට බෙදී ගොසී ඇත. මේවායින් ප්‍රධානතම කුලය වන්නේ ගොවිගම් කුලයයි. ගොවිගම් කුලයේ අය අතර වුවද විෂමතාවයක් තිබීම මෙම ගමේ සමාජ රටාවේ වැදගත් ලක්ෂණයකි.. පාරම්පරික වශයෙන් අළුත්නුවර දේවාලය හා සම්බන්ධකම් ඇති පවුල් කිහිපයක්ම එම ගමෙහි සාමාජික මෙන්ම ආර්ථික අතින්ද වැදගත් තැන් උසුලයි. මුස්ලිම් ජන සමූහය අතර වුවද ඇතැම් පවුල් කිහිපයක් ප්‍රධාන තැනක් ගනී. විවිධ කණ්ඩායම් අතර පවතින දේශපාලන විරුද්ධවාදී කම් තිබුනත් ජාති භේද වාදිකම් හෝ කුල ගැටුම් පැහැදිලිව දක්නට නොමැත. දේශපාලන විසමතාවය වුවද පවතිනුයේ ගැමියන් විසින්ම අනුගමනය කරන දේශපාලනමය මතිමතාන්තර නිසා නොව තමන්ගේ වරප්‍රසාද සහ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට අවශ්‍යව සිටින යම් යම් පවුල් විසින් මේ ප්‍රදේශ තුල පතුරුවා ඇති ආකල්පයන් නිසාය. මෙම ක්‍රියාවලිය ඇත්ත වශයෙන්ම නියම නායකයන් බිහි කිරීමට බාධාවක්ව පවතී. ටික දෙනෙක් අතර පවතින ගැටීම නිසා ගමෙහි සංවර්ධනය උදෙසා කවර ඒකාබද්ධ වැඩ පිළිවෙලක් වුවද ඉදිරිපත් කිරීම අපහසු කාර්‍යයක්ව ඇත. (ගමෙහි සමුපකාර සමිතියේ කාරක සභාවට නිලධාරීන් තෝරා ගැනීම සඳහා පැවති පසුගිය ඡන්ද විමසීමේදී කලබල ඇති වීම වැලැක්වීම සඳහා පොලිසියට ද පැමිණ සිටීමට සිදු විය.)

ගොවි කාරක සභාවේ පසුතලය.

අළුත්නුවර ප්‍රදේශය සඳහා වූ පළමුවැනි ගොවි කාරක සභාව 1958 දී තෝරා ගන්නා ලද අතර දෙවැන්න 1961 දීත්, තෙවැන්න 1965 දීත්, වර්තමාන ගොවි කාරක සභාව 1969 දීත් තෝරා ගනු ලැබීනි. ලබා ගත් තොරතුරුවලට අනුව ගොවි කාරක සභාවට සාමාජිකයන් තෝරා ගැනීම සඳහා වූ පසුගිය ඡන්ද විමසීම යෝග්‍ය අයුරින් පවත්වනු නො

ලැබීන. හමු වී සාකච්ඡා කළ ගොවීන් අතුරින්, මෙම කාරක සභාව තෝරා ගත් අයුරු දැනගෙන සිටියේ ගොවීන් දෙදෙනෙක් පමණකි. එසේම සාමාජිකයින් තෝරා ගැනීම සඳහා කැඳවන ලද රැස්වීමට සහභාගිව ඇත්තේ ඔවුන්ගෙන් එක් අයෙකු පමණකි.

වර්තමාන පාලක ලේකම් වරයා පත් කරගනු ලැබ ඇත්තේ රැස්වීමට පැමිණ සිටි බොහෝ දෙනාගේ මනාපයට එරෙහිවය.

ආරම්භයේ සිටම ගොවි කාරක සභාවේ ක්‍රියාකාරීත්වය බෙහෙවින් අසතුටුදායක තත්වයක පැවැත්ව ඇත. මෙම ගොවි කාරක සභාව පිළිබඳව අහිතකර අදහස් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් පවා බොහෝවිට ඉදිරිපත් වී ඇති බව පෙනේ.

ගොවි කාරක සභාවේ සංයුක්තිය ගැන සලකන විට එය ... ගොවීන් නියෝජනය කරන එකක් බව නො පෙනේ. ඇතැම් සාමාජිකයන් ඉඩම් හිමියන් හෝ ගොවිතැන් නො කරන්නන් වන අතර ප්‍රදේශයේ සාමාජික හා ආර්ථික වශයෙන් බලවත් කොටසට ද අයත් වෙති.

3.2 ගොවි කාරක සභාව සමන්විත වන්නේ එක් දේශපාලන කණ්ඩායමකට අයත් පුද්ගලයන්ගෙන්ය. විශේෂයෙන් එහි නිලතල දරන්නෝ දේශපාලන වශයෙන් ක්‍රියාකාරී පුද්ගලයෝ වෙති. කෙසේ වෙතත් ග්‍රාමීය සංවර්ධනය උදෙසා ගොවි ජනතාවගේ සහයෝගය ලබා ගැනීමට මෙම තත්වය යටපත් වුවත් ගොවි කාරක සභාවේ නිලතල දරන්නන් හට නොහැකි වී ඇති බව පෙනී යයි. ග්‍රාමීය සංවර්ධනය සඳහා ගොවි කාරක සභාවේ නිලතල දරන්නන් සැලකිල්ලක් නො දක්වන බවට කමිටුවේ සාමාජිකයන් අතර වුවද තදබල හැඟීමක් පවතියි. පාලක ලේකම් සහ කාරක සභාවෙහි සාමාජිකයන් අතර ද අන්‍යෝන්‍ය වශයෙන්ම සහයෝගයක් දක්නට නොමැත. ගොවි කාරක සභාවේ නිලතල දරන්නන් සහ සාමාජිකයන් අතර ක්‍රියාකාරී සහයෝගයක් නැති වීමට හේතු වූ ප්‍රධාන කරුණු පහත සඳහන් පරිදි සංක්ෂිප්ත වශයෙන් දැක්වීමට පුළුවන.

(අ) නිලතල දරන්නන් සහ පාලක ලේකම් ගොවීතැන් කටයුතු නොකරන්නවුන් වීම;

(ආ) නියම නායකත්වයක් නොමැතිකම සහ ඒ නිසා ඇතිවන නොසැලකීම;[1]

(ඇ) පාලක ලේකම් සහ ගොවි කාරක සභාවේ සාමාජිකයන් අතර ඇති දේශපාලන විෂමතාව.

ගොවි කාරක සභාවට ස්ථිර කාර්යාලයක් නොමැත. පාලක ලේකම් ගේ නිවසේ තබා ඇති පොත් පත් හා වාර්තා නිසි පරිදි පවත්වා ගෙන ගොස් නොමැත.

ගොවි කාරක සභාවේ රැස්වීම් ද ක්‍රමානුකූලව පවත්වා නැත. 1972 අවුරුද්ද සඳහා එය සෑම තුන් මසකටම වරක් පමණි රැස්වීම් පවත්වා ඇත්තේ. මෙම රැස්වීම්වලට සහභාගි වූ සාමාජිකයන්ගේ සංඛ්‍යාව ඉතාමත් අඩුය. අවුරුදු ගණනාවකට පසු 1973 මැයි මස 24 වැනි දින පවත්වන ලද එකම කන්න රැස්වීමකදී ගොවි කාරක සභාවේ සාමාජිකයන් 12 දෙනාගෙන් පැමිණ සිටියේ 6 දෙනෙක් පමණකි.

මෙම රැස්වීම්වලදී සාකච්ඡාවට භාජනය වන කරුණු එම ප්‍රදේශයේ ගොවීන්ගේ ප්‍රශ්න හා සම්බන්ධ වූවේ ඉතාමත් කලාතුරකිනි. ඒවාහිදී නැවත නැවතත් සාකච්ඡා කර ඇත්තේ අක්කර බද්ද රැස් කිරීම පිළිබඳව වූ ගැටළු ගැනය. සාකච්ඡා කළා යයි වාර්තා ගත වී ඇති කරුණු ඉතාමත් ස්වල්ප නිසාත් සාමාජිකයින්ගේ නම් සහ අත්සන් වාර්තා පොතෙහි දක්නට නො ලැබීම නිසාත් මෙහි කාරක සභා රැස්වීම් ඇත්ත වශයෙන්ම පවත්වන ලද්දේදැයි වුවද සැක සහිතය. 1973 ට පෙර කන්න රැස්වීම් නො පැවැත්වීම සැළකිය යුතු කරුණකි.

ගොවි කාරක සභාව නිවැරදි ගොවි නාම ලේඛනයක් පවත්වාගෙන නොයයි. මෙය ඇත්ත වශයෙන්ම අඳ ගොවීන්ට බරපතල බාධාවකි. ඔවුන්ගේ අඳ ගොවි අයිතිවාසිකම් පිළිබඳ සඳහන් පවතින එකම ලේඛනය මෙය වන හෙයිනි. මේ හේතුකොටගෙන සතුටුදායක පදනමක් මත ඉඩම් ආරවුල් නිරාකරණය කිරීමට ගොවි කාරක සභාවට හැකි වී නැත.[2]

අක්කර බද්ද එකතු කිරීම වුවද ගොවි කාරක සභාවෙන් කෙරෙන්නේ ඉතාමත් අසතුටුදායක අන්දමටය. ආරම්භයේ සිටම මෙම ගොවි කාරක සභාව රැස් කර ඇත්තේ රු. 1400/- පමණකි. මෙය එක් අවුරුද්දකට ගොවි කාරක සභාවට ලැබීමට නියමිත අක්කර බද්දෙන් 4% ක් පමණ වේ. පාලක ලේකම් විසින් රැස් කර ගනු ලබන බදු ක්‍රමානුකූලව භාණ්ඩාගාරික හට භාර දී නැත. පාලක ලේකම් වාර්තා පවත්වාගෙන ගියේදැයි භාණ්ඩාගාරික නොදනී.

---

1. රල්/ප් පීරිස්ගේ සිංහල සමාජ සංවිධානය බලන්න.
2. ගොවි කාරක සභාව විසින් ගොවි නාම ලේඛනය හරිහැටි පවත්වාගෙන යන්නේ නැති නිසා අඳ ගොවීන් පිළිබඳව නියම තොරතුරු ලබා ගැනීමට නොහැකි විය. විහාර හා දේවාල ඉඩම් වගා කරමින් රාජකාරී සේවාවන් කරන අය අඳ ගොවීන් වශයෙන් ලියා පදිංචි වී සිටියේ නැත.

අනිකුත් නිලතල දරන්නෝ කමිටුවෙහි මුදල් තත්වය සම්බන්ධව කිසිවක් නොදනී. මේ අතර අප හමු වී සාකච්ඡා කළ සියළුම ගොවීන් පාහේ ගොවි කාරක සභාවේ අවංක බව පිළිබඳව ඔවුන්ගේ සැකය පළ කළහ. නිලතල දරන්නන් ද වැඩි සංඛ්‍යාවක් අක්කර බදු නොගෙවයි. ගොවීන් අතරින් ද මෙය ක්‍රමානුකූලව ගෙවනු ලැබුවේ වැඩි හරිය අඳ ගොවීන් විසින්ය. ඔවුන් එසේ ගෙවන්නේ තමන්ගේ අඳ ගොවි අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහාය. අක්කර බදු ගෙවන තවත් ගොවීන් කිහිප දෙනෙක් කියා සිටියේ ඔවුන් බදු ගෙවන්නේ පාලක ලේකම් නිතර පැමිණ කරන කරදරයෙන් වැළැක්වීම සඳහා බවයි.

ගොවි කාරක සභාව වෙන වෙනම අවුරුදු දෙකකදී අමුනක් සෑදීම සඳහා රු. 1400/-ක් වැය කර ඇත. මේ හැරෙන්නට සංවර්ධන වැඩ කටයුතු සඳහා අනිකුත් වියදමක් දරා නැත.

කිසිදු සංවර්ධන වැඩක් (විශේෂයෙන් සුළු වාරිමාර්ග ක්ෂේත්‍රයෙහි වැඩ) කිරීම සඳහා වර්තමාන ගොවි කාරක සභාව සැළකිල්ලක් දක්වා නැත. ගොවීන් විසින් නවීන වගා ක්‍රම අනුගමනය කරනු ලැබීම දිරිමත් කිරීම සඳහා ද ප්‍රයත්නයක් දරා නැත. එසේම ගොවිතැන් කටයුතුවලට උවමනා කරන උපකරණ ගොවීන් හට ලබා දීමටත් අවශ්‍ය යෙදවුම් සපයා දීමටත් ගොවි කාරක සභාව කටයුතු පිළියෙල කර නැත. ව්‍යාප්ති සේවාවන් මාර්ගයෙන් ගොවි පුහුණු වැඩ සටහන් වුවද පිළියෙල කර නැත. ගොවීහු ඔවුන්ට අවශ්‍ය පොහොර කෘෂි රසායනික ද්‍රව්‍ය ආදිය ගමෙහි සමුපකාරයෙන් ලබා ගන්නා අතර බීජ වී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ව්‍යාප්ති සේවක මගින් ලබා ගනු ඇත.

මෙම ප්‍රදේශයෙහි ගැමි ජනතාවගෙන් වැඩි දෙනා ගොවි කාරක සභාව පිළිබඳව එක්කෝ උදාසීනත්වයෙන් යුතුව සළකන අතර, එසේ නැතහොත් ඒ පිළිබඳව කිසිදු සැළකිල්ලක් නො දක්වති. හමු වී සාකච්ඡා කළ ගොවීන් 13 දෙනෙකුගෙන් 11 දෙනෙක්ම ගොවි කාරක සභාවේ නිලතල දරන්නන් පිළිබඳව දැන සිටියේ නැත. නිලතල දරන සියළු දෙනා ගැනම දැන සිටියේ එක් අයෙක් පමණකි. එක් අයෙක් හැරෙන්නට හමු වී සාකච්ඡා කළ සියළුම ගොවීන් දැරූ මතය වූයේ ගොවි කාරක සභාව මෙතෙක් කිසිදු ප්‍රයෝජනවත් සේවයක් ඉටු කර නැති බවයි. මෙය ගම දියුණු කිරීමට ඇති ආයතනයකට වඩා ගමෙහි ප්‍රගතියට ඇති බාධකයක් යයි ඇතැම් අය ප්‍රකාශ කළහ.

ග්‍රාමීය මට්ටමෙහි දී කෘෂිකර්ම සංවර්ධන සැලසුම් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථය සඳහා ගොවි සංවිධානයන් විසින් සකස් කරනු ලබන ක්‍රියාත්මක වැඩ සටහන්වල විශ්වාසනීයත්වය පහත සඳහන් කරුණු මත රඳා පවතී.

1. ගොවි කාරක සභාව කාර්යක්ෂම අයුරින් ක්‍රියාකාරී වීම සහ මෙම සැලසුම් සකස් කිරීමට ගොවි කාරක සභාවත් ගොවීනුත්, සහභාගී වීම;
2. සැලසුම් සකස් කිරීමෙහි ලා සමූපකාරය වැනි අනෙකුත් සංවිධාන සහ ග්‍රාමීය මට්ටමේ සේවකයන් ද ගොවි නායකයන් ද සම්බන්ධ වන ප්‍රමාණය.

අළුත්නුවර ගොවි කාරක සභාව පිළිබඳව සලකා බලන කල්හි මෙම පූර්ව අවශ්‍යතාවන් කවර අාකාරයකින්වත් තිබුනේ නැත. 1972-73 සඳහා ක්‍රියාත්මක වැඩ සටහන් පාලක ලේකම් විසින් පමණක් සකස් කරනු ලැබූවකි. එහෙයින් ක්‍රියාත්මක වැඩ සටහනෙහි දක්වා තිබූ කරුණු හුදෙක් කල්පිත වූ ඒවා අතර එම ප්‍රදේශයෙහි විද්‍යාව සම්පත් වලටත් ගැමි ජනතාවගේ දක්ෂතාවයටත් අවශ්‍යතාවයන්ටත් කවර හෝ සම්බන්ධතාවයක් නොතිබිනි.

මෙම වැඩ සටහනෙහි අන්තර්ගත කළ යුතු කරුණු තමා මැනවින් දත් හෙයින් ගොවි කාරක සභාව හෝ ගොවීයන් සඳහා සාකච්ඡා කිරීමට කිසිව අවශ්‍යතාවයක් ද නොවූ බවත් පාලක ලේකම් නොසඟවා පළ කළේය. ඇත්ත වශයෙන් ඔහු විසින් කරන ලද්දේ ක්‍රියාත්මක වැඩ පිළිවෙලේ ප්‍රශ්න මාලාව හවස් වරුවක තමා සමූපකාරයේ මුර සේවයේ යෙදී සිටින අතරදී සම්පූර්ණ කිරීමයි.

මේ ප්‍රදේශයෙහි වී ගොවිතැන සම්බන්ධයෙන් පවතින බරපතල බාධකයක් නම් වාරිමාර්ග පහසුකම් නොමැති කමයි. එක් අමුණක් ඉදි කිරීම හැරෙන්නට මේ සම්බන්ධයෙන් ගොවි කාරක සභාව කිසිවක් කර නැත. ජලය නො ලැබෙන නිසා යල කන්නයේදී සෑහෙන කුඹුරු ඉඩම් ප්‍රමාණයක් වගා නො කෙරෙයි. හමු වී සාකච්ඡා කළ ගොවීන් 13 දෙනාගෙන් එක් අයෙක් 1972 යල කන්නයේදී ඔහුගේ කුඹුරු වැඩ නොකළ අතර තවත් අයෙක් තම කුඹුරු වල එළවළු වගා කර තිබුනි. හමු වී සාකච්ඡා කළ සියළුම ගොවීහු මහ කන්නයේ දී ඔවුන්ගේ කුඹුරුවල ගොයම් හිටවා ඇති අතර 11 දෙනෙකුගෙන් 4 දෙනෙක් පමණක් යල කන්නයේදී එසේ ගොයම් හිටවා ඇත. පැරණි වැව් අළුත්වැඩියා කිරීමෙන් ජලය පිළිබඳ ප්‍රශ්නය තරමක් දුර මඟ හරවා ගත හැකි බව ගොවීහු බොහෝ දෙන කියා සිටියහ.

3 සටහන

වපුරන ලද වී වර්ග

| | මහ 71/72 | යල 1972 |
|---|---|---|
| බී.පී. 11-11 | 4 | 5 |
| එච් වර්ග | 6 | 6 |
| සම්ප්‍රදායික වර්ග | 2 | - |
| එකතුව | 12 | 11 |

එක් ගොවියෙක් බී.ජී. 34-8 සමඟ බී.පී. 11-11 වගා කළේය.

ව්‍යාප්ති සේවාවන්ගේ ආධාරය ඇතිව ගොවි කාරක සභාව දියුණු කරන ලද වී වර්ග ජනප්‍රිය කිරීමට දැඩි ප්‍රයත්නයක් දරන කෙහෙල්පත්තල මෙන් මෙහි නව වී වර්ග අනුගමනය කිරීමට දරන ප්‍රයත්නය එතරම් සිත් ඇද ගන්නා සුළු නොවේ. විශේෂයෙන් යල කන්නයේදී පැරණි දියුණු කරන ලද වර්ග එනම් එච් වර්ග ගොවීන් යොදා ගනුයේ ප්‍රමාණවත් අයුරින් ජලය ලබා ගැනීමට නොහැකි වීම නිසා විය හැකිය.

මහ කන්නයේදී ගොවීන් දොළොස් දෙනෙකුගේ ද යල කන්නයේදී ගොවීන් දස දෙනෙකුගේ ද පොහොර භාවිතය පිළිබඳව දත්ත ලබා ගත හැකි විනි. පරිභෝජන ප්‍රමාණය මහ කන්නයේද දී අක්කර 12 ක් සම්බන්ධයෙන් හොණ්ඩර 24.5 ක් වූ අතර යල කන්නයේ අක්කර 9.5 වෙනුවෙන් හොණ්ඩර 14 ක් ද විය. මහ හා යල කන්න සම්බන්ධයෙන් අක්කරයකට යෙදූ පොහොර ප්‍රමාණය පිළිවෙලින් අක්කරයකට හොණ්ඩර 2.04 සහ 1.47 කි. විශේෂයෙන් යල කන්නයේදී මෙම ප්‍රමාණය නිර්දේශ කරන ලද ප්‍රමාණයට වඩා අඩුය. මහ කන්නයේ මෙන්ම යල කන්නයේ දී ද ගොවීහු බොහෝ දෙනෙක් කෘමි නාශක ද්‍රව්‍ය භාවිතා කර ඇතත් රසායනික ද්‍රව්‍ය සහ බෙහෙත් ඉසින යන්ත්‍ර ලබා ගැනීමෙහි ලා පවතින දුර්වලතා පිළිබඳව ඔව්හු පැමිණිලි කළහ.

මහ කන්නයේ අස්වනු පිළිබඳව අක්කර 10 කින් ද යල කන්නයේ අස්වනු පිළිබඳව අක්කර 10 1/2 කින් ද තොරතුරු ලබා ගැනීමට හැකි විය. ඒ එක් එක් කන්නයේ අක්රයකින් ලද සාමාන්‍ය අස්වැන්න පිළිවෙලින් බුසල් 47 1/2 සහ බුසල් 50 විය. ඒ ඒ කන්නයේදී අක්කරයකින් ලද අස්වැන්න ප්‍රමාණය විචලනය වූයේ මෙසේය. මහ කන්නයේදී බුසල් 22 – 64 දක්වාත්, යල් කන්නයේදී බුසල් 10 – 65 දක්වාත්ය. කිසිම ගොවියෙකු ක්‍රියාත්මක වැඩ පිළිවෙලේ ඉලක්කය වූ අක්කරයට බුසල් 70 ලබා ගත්තේ නැත. මේ ඉලක්කය තීරණය කරන ලද්දේ එතරම් හිතා බලා නොවේ.

කෙසේ වුවද මේ ගොවි කාරක සභා දෙක අතර, ක්‍රියාත්මක වීමේ කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් ඇති වෙනස්කම තරම් වෙනස්කමක්, ගොවිතැන් මට්ටම් සම්බන්ධයෙහි නැත. විශේෂයෙන් අස්වැන්න ගැන සළකනවිට මේ ගොවි කාරක සභා ප්‍රදේශ දෙක අතර එතරම් වෙනස්කමක් නැත. කෙසේ වුවද ගොවි ආයතනයක කාර්යක්ෂමතාවය මැනීමේදී අස්වැන්න ගැන පමණක් සලකා බැලිය යුතු නැත. එයට හේතුව මෙවැනි ආයතනයකින් අස්වනු වැඩි කිරීමට උත්සාහ කරනවාට අමතරව ගොවි ජනතාවගේ ශුභ සිද්ධිය ඇති කිරීමට ආධාර වන වෙනත් බොහෝ දේ කළයුතු බැවිනි. මේ ලක්ෂණ අළුත්නුවර ගොවි කාරක සභාවේ දක්නට ලැබෙන්නේ නැත.

ක්‍රියාත්මක වැඩ පිළිවෙල සකස් කිරීමේ පදනම පිළිබඳව මූලික ප්‍රශ්නයක් අළුත්නුවර ගොවි කාරක සභා අධ්‍යයනය තුලින් මතු කරයි. මෙය වූ කලී සම්පූර්ණයෙන්ම වාගේ ක්‍රියා විරහිත මෙන්ම ගමේ කෘෂිකාර්මික කටයුතුවලට එතරම් සම්බන්ධකමක් නො දක්වන ගොවි කාරක සභාවක් ක්‍රියාත්මක වැඩ පිළිවෙල සකස් කිරීමෙහි නියැලී සිටීමයි. මේ වැඩ පිළිවෙල සකස් කිරීමේදීත් ක්‍රියාත්මක කිරීමේදීත් ප්‍රදේශයේ අවශ්‍යතාවයන් පිළිබඳව මේ

කමිටුව නිසිසේත්ම සළකා බලන බවක් පෙනෙන්නට නැත. එනිසා කිසියම් ප්‍රදේශයක ඇති ගොවි කාරක සභා වලින් වැඩි කොටසක් අකාර්යක්ෂම ඒවා වන්නේ නම්, ඒවා මගින් සපයනු ලබන තොරතුරු මත සකස් කරනු ලබන ප්‍රාදේශීය හා දිස්ත්‍රික් වැඩ පිළිවෙලවල් අකාර්යක්ෂම ඒවා බවට පත් වේ.

## 4. නිගමන සහ නිර්දේශ

ග්‍රාමීය මට්ටමේදී කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වැඩ පිළිවෙලවල් සකස් කිරීමේ වගකීම පැවරී ඇති ග්‍රාමීය ආයතනවල, යම් යම් මූලික ලක්ෂණ තිබිය යුතු බව ගොවි කාරක සභා දෙකක් පිළිබඳව කරන ලද මේ අධ්‍යයනයෙන් පෙන්නුම් කෙරේ.

ගොවි කාරක සභාවක සාර්ථකත්වය නිශ්චය කරනු ලබන ඉතා වැදගත් සාධකය නම් නායකත්වයයි.(1)

මේ අතින් ගොවි කාරක සභා දෙක අතර මූලික වෙනස්කම් දක්නට ලැබේ. කෙහෙල්පන්නල ගොවි කාරක සභාවේ කාරක සභිකයන් මෙන්ම නිලධාරීන් ද ගොවීන් වන අතර, ඔවුන් ගොවි ජනතාව නියෝජනය කරන්නන්ද වේ. ගමේ ඇති ප්‍රශ්න පිළිබඳ මූලික හැඟීමක් ඔවුන්ට තිබේ. කුල භේදය සහ දේශපාලන බෙදීම් නිසා ඇති විය හැකි වෙනස්කම් නැති කිරීම මගින් මොවුන්ට ගමේ ජනතාවගේ සහයෝගය ලබා ගැනීමට හැකි වී ඇත. ගොවීන්ගේ සහයෝගය ඇතිව කෘෂිකර්මික සංවර්ධනය සඳහා මෙවැනි ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් යොදා ගැනීමට මොවුන්ට හැකි වී තිබේ.

අළුත්නුවර ගොවි කාරක සභාවට සාර්ථක නායකත්වයක් නොමැති අතර, එම නිසාම කාර්යක්ෂම ආයතනයක් වශයෙන් කටයුතු කිරීමට ද එයට නොහැකි වී ඇත. මේ ගොවි කාරක සභා දෙකෙහි නිලධාරීන්ට කොතෙක් දුරට නියම නායකත්වයක් දිය හැකි ද යන්න පහත සඳහන් විස්තරයෙන් පැහැදිලි වේ.

| කෙහෙල්පන්නල | අළුත්නුවර |
|---|---|
| 1. කාර්ය බද්ධ නායකත්වය | 1. සම්ප්‍රදායික නායකත්වය |
| 2. දේශපාලන කටයුතුවල තදින් නියැලී නැත | 2. දේශපාලනයෙහි තදින් නියලී ඇත. |
| 3. ගැමියන් හා කිට්ටු සම්බන්ධතාවයක් දක්වයි | 3. සාමාන්‍ය මිනිසුන් සමග එතරම් සම්බන්ධයක් නැත. |
| 4. ගොවිතැන ගැන උනන්දුවක් ඇත. | 4. ගොවිතැන ගැන එතරම් උනන්දුවක් නැත. |
| 5. ගම තුළ ඇතැම් වෙනස්කම් ඇති කිරීමටද අධ්‍යාපනය දියුණු කිරීමට ද උත්සාහ ගනී. | 5. වෙනස්කම් ඇති කිරීමෙහි ලා එතරම් උනන්දුවක් නැත. |

1. පාලක ලේකම් ඇතුළු නිලධාරී මණ්ඩලයත්, මුළු ගොවි කාරක සභාවත් නායකත්වය යනුවෙන් අදහස් කෙරේ.

ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වලදී ග්‍රාම සේවක, කෘෂිකර්ම ව්‍යාප්ති සේවක වැනි ගම් මට්ටමේ නිලධාරීන් ද, සමූපකාර සමිති වැනි ආයතනවල ද සහභාගිත්වය ලබා ගැනීමට කෙහෙල්පත්තල ගොවි කාරක සභාව සමත් වී ඇත. ග්‍රාමීය නිලධාරීන්ගෙන් සහ ආයතන වලින් සහයෝගය ලබා ගැනීමට අළුත්නුවර ගොවි කාරක සභාවට නොහැකි වී තිබේ.

ගොවි කාරක සභා දෙකෙහි කටයුතු සංසන්දනාත්මකව සාරාංශ කොට ඇති පහත සඳහන් ලේඛනයේන් ගොවි කාරක සභාවක කාර්යක්ෂමතාවය කෙරෙහි නියම නායකත්වය කොතෙක් දුරට බල පාන්නේදැයි පැහැදිලි වේ.

| කටයුත්ත | කෙහෙල්පත්තල | අළුත්නුවර |
|---|---|---|
| (අ) | | |
| 1. කාර්යාලය | ස්ථිරය | ස්ථිර කාර්යාලයක් නැත. |
| 2. සභා රැස්වීම් | නිතිපතා පවත්වනු ලැබේ. | නිතිපතා පවත්වනු නොලැබේ. |
| 3. කන්න රැස්වීම | සෑම කන්නයක් පටන් ගැනීමට කලින් පවත්වයි. | එසේ පවත්වන්නේ නැත. |
| 4. ගොවි නාම ලේඛනය | හොඳින් පවත්වාගෙන යන අතර වර්ෂයෙන් වර්ෂයට අලුත් කරයි. | හොඳින් පවත්වාගෙන යන්නේ නැත. වර්ෂයෙන් වර්ෂයට අලුත් කරන්නේද නැත. |
| (ආ) | | |
| 1. වගා කාල සටහන් | සකස් කරනු ලබන අතර අනුගමනය කිරීමද කරයි. | සකස් කරනු නො ලැබේ. |
| 2. වාරිමාර්ග වැඩ | මූලික ව්‍යුහය සකස් කොට ඇති අතර නඩත්තු කිරීමද කරනු ලැබේ. | වාරිමාර්ග පහසුකම් නැත |
| 3. යෙදවුම් සැපයීම | සමූපකාරය තුළින් සහ ව්‍යාප්ති කටයුතු මගින් සකස් කොට ඇත. | මෙවැනි සැලසුම් නොමැත. |
| 4. උපකරණ | කුලියට දීම සඳහා බෙහෙත් ඉසින යන්ත්‍රයක් තිබේ. | කිසිම උපකරණයක් නැත. |
| (ඇ) | | |
| 1. අද ගොවීන්ගේ අයිතිවාසිකම් | මේවා ගැන සලකනු ලැබේ. | මේවා ගැන සලකනු නො ලැබේ. |
| 2. ගොවීන්ගේ පැමිණිලි | මේවා ගැන සලකා බලනු ලැබේ. | සලකා බලනු නො ලැබේ. |

| කටයුත්ත | කෙහෙල්පන්නල | අළුත්නුවර |
| --- | --- | --- |
| (ඈ) | | |
| 1. ගැමියන් ඒකරාශී කොට සංවර්ධනය සඳහා යොදා ගැනීම. | සාර්ථකය | අසාර්ථකය |
| 2. ව්‍යාප්ති කටයුතු | පුහුණු කිරීමේ පන්ති සංවිධානය කරනු ලැබේ. | මේ ගැන උදාසීනත්වයක් දක්වයි. |
| (ඉ) | | |
| 1. අක්කර බදු | ගොඩින් එකතු වේ. | සතුටුදායක නැත. |
| 2. මූල්‍ය තත්වය | සතුටුදායකය. | අසතුටුදායකය. |

මේ විස්තර අනුව කෙහෙල්පන්නල ගොවි කාරක සභාව අංග සම්පූර්ණ සහ පරමාදර්ශී එකක් යැයි අවබෝධ කරගත යුතු නැත. මෙහි ලා වැදගත් වන්නේ ප්‍රදේශයේ ගොවීන්ට කෙළින්ම වැදගත්කමක් ඇති යම් යම් ක්‍රියාත්මක වැඩ පිළිවෙලවල් සකස් කිරීමටත්, ඒවා ක්‍රියාත්මක කිරීමටත් එයට හැකි වී තිබීමයි. නීති විරෝධී ලෙස අඳ ගොවීන් පන්නා ගැනීම වැළැක්වීම මගින් අඳ ගොවීන්ට ආරක්ෂාව සැපයීමටත් බොහෝදුරට එයට හැකි වී තිබේ. කෙසේ වුවද කුඹුරු පනත යටතේ ඇති බිම් කුලිය පිළිබඳ නීති රීති ක්‍රියාත්මක කිරීමට මේ ගොවි කාරක සභාවට ද හැකි වී නොමැත. උඩරට ප්‍රදේශයේ පවතින යම් යම් සමාජ ආර්ථික සාධකයන් මෙහි ලා බලපායි.

කෙහෙල්පන්නල ගොවි කාරක සභාවේ ඇතැම් දුර්වලකම් තිබුණද, එය අළුත්නුවර ගොවි කාරක සභාවට වඩා සාර්ථක අන්දමකින් ක්‍රියාත්මක වැඩ පිළිවෙල සකස් කිරීමට මැදිහත් වී ඇති බව පෙනී යයි. යම් යම් ක්‍රියාත්මක වැඩ පිළිවෙලවල් කරගෙන යාමෙන් ප්‍රායෝගික පුහුණුවක් ලබා ඇති කෙහෙල්පන්නල ගොවි කාරක සභාව වැනි ගොවි කාරක සභාවලට නියම පුහුණුවක් සහ මග පෙන්වීමක් ලබා දුන්නොත් ඒවා ඉතා සාර්ථක, ග්‍රාමීය මට්ටමේ සැලසුම් ආයතන බවට පත් වනු ඇත.

මේ ගොවි කාරක සභා දෙක ක්‍රියාත්මක වැඩ පිළිවෙලවල් සකස් කරන ලද්දේ ද එකිනෙකට වෙනස් ආකාරයකිනි. අළුත්නුවර ගොවි කාරක සභාව මේ පිළිබඳව උදාසීනත්වයක් දැක්වීය.

1. වැඩ පිළිවෙල සාකච්ඡා කර ඉලක්ක තීරණය කිරීම සඳහා ගොවි කාරක සභාව කෙදිනකවත් රැස් වන්නේ නැත. එය සකස් කරන ලද්දේ ද පාලක ලේකම් විසිනි.
2. වැඩ පිළිවෙල සකස් කිරීමේදී ගොවි කාරක සභාවේ නිලධාරීන්ගෙන්වත්, ව්‍යාප්ති නිලධාරීන්ගෙන්වත්, සමුපකාර සමිති කළමනාකරු ගෙන්වත් විමසා බැලුවේ නැත.
3. වැඩ පිළිවෙල සකස් කිරීමේදී ක්‍රියාත්මක තත්වයක නොපැවති දුර්වල ගොවි කාරක සභා විසින් ගමේ සිටින ගොවි නායකයන්, රජයේ නිලධාරීන් සහ

සමුපකාර සමිතිවල කළමනාකරුවන් වැනි අයගෙන් සමන්විත අවධිමත් කමිටුවක සහාය ලබා ගන්නට බලාපොරොත්තු වූ නමුදු මෙහිදී එවැන්නක් ද සිදු නොවීය.

මේ සාධකයන් නිසා අළුත්නුවර ගොවි කාරක සභාව විසින් සකස් කරන ලද ක්‍රියාත්මක වැඩ පිළිවෙල නියම තත්වය නිරූපණය කරන එකක් නොවීය. මෙවැනි වැඩ පිළිවෙලවල් නොමග යවන සුළු ඒවා වන අතර ඒවා විසින් ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් වැඩ පිළිවෙලවල් අස්වාභාවික ඒවා බවට පත් කරනු ඇත. යම් දිස්ත්‍රික්කයක ගොවි කාරක සභා වැඩි ගණනක මේ තත්වය පවතින්නේ නම් එමගින් ජාතික ක්‍රියාත්මක වැඩ පිළිවෙල ද අස්වාභාවික එකක් වනු ඇත.

ක්‍රියාත්මක වැඩ පිළිවෙල සකස් කරන ලද්දේ පහත සඳහන් සිතා ගැනීම් දෙක පදනම් කරගෙනය:

1. ගොවි කාරක සභාවේ සාමාජිකයින් ගමේ සිටින අත්දැකීමක් ඇති ගොවීන් බව සහ ගොවි ජනතාවගේ අවශ්‍යතාවයන් මොනවාද කියා හොඳින් දන්නා බව;
2. ගොවි කාරක සභාව විසින් ප්‍රදේශයේ සිටින සියළුම ගොවීන් නියෝජනය කරන බව.

ගොවි කාරක සභාවේ සියළුම සාමාජිකයින් අත්දැකීම් ඇති ගොවීන් වන නමුදු ඔවුන් සැමවිටම මුළු මහත් ගොවි ජනතාවම නියෝජනය කරන්නන් නොවෙති. ගමේ සමහර කොටස් ගැන ඔවුන් නොතකා සිටීමට ඉඩ තිබේ. ගොඩ ඉඩම් සහ පශු පාලනය දියුණු කිරීමේදී මතු වන ගැටළු ගැන සළකා බලනවිට මේ විශේෂයෙන්ම පැහැදිලි වේ. මේවා ගැන වැඩ පිළිවෙලක් සකස් කිරීමට ගොවීන්ගේ උපදෙස් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. මෙනිසා ක්‍රියාත්මක වැඩ පිළිවෙල සකස් කිරීමේ මූලික දුර්වලතාවයන් වන්නේ ගොවීන්ගේ සහයෝගය එහි ලා ලබාගෙන නොමැති වීමයි. කෙහෙල්පන්නල ගොවි කාරක සභාව පිළිබඳව වුවද මෙම විවේචනය සාධාරණය.

ගොවිපලවල් සඳහා සැලසුම් සකස් කිරීම පිළිබඳවත්, නිෂ්පාදන වැඩ පිළිවෙල සකස් කිරීම පිළිබඳවත් ගොවි කාරක සභාවට එතරම් පුහුණුවක් නැත. ප්‍රදේශයේ කෘෂිකාර්මික සංවර්ධනයට සම්බන්ධව කටයුතු කරන සහ ක්‍රියාත්මක වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමෙහි ලා නියැලී සිටින, අත්දැකීම් සහිත නිලධාරීන්ගේ සේවය ද අවශ්‍ය අවස්ථාවන් වලදී ගොවි කාරක සභාවට ලැබී නොමැත. හොඳින් සිතා බලා සකස් කළ සමාජ–ආර්ථික නිර්ණායකයන් පදනම් කරගෙන ප්‍රමුඛත්වයන් තීරණය කිරීමක් ද මෙහිදී සිදු වී නොමැත. මේ වැඩ පිළිවෙල සැලකිය හැක්කේ ඒ වෙලාවට සිතට පහල වූ අවශ්‍යතාවයන් මත පදනම් වූ අනුමාන ආශ්‍රයෙන් සකස් කළ ඇස්තමේන්තුවල එකතුවක් ලෙස පමණි.

සැලසුම් සම්පාදනය සහ වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම එකිනෙකට සම්බන්ධ, නොකඩවා කරගෙන යන ක්‍රියාවලියන් දෙකක් වේ. එසේ වුවද ක්‍රියාත්මක වැඩ පිළිවෙලේ වඩාත්ම වැදගත් වූ අංශය වන ක්‍රියාත්මක කිරීම සිදු වී ඇත්තේ ඉතාමත්ම අසතුටුදායක අන්දමකිනි.

ක්‍රියාත්මක වැඩ පිළිවෙල සකස් කොට දිසාපතිතුමා වෙත යැව්වාට පසු එය පිළි ගත්තාද, ප්‍රතික්ෂේප කළාද, එසේ නැත්නම් වෙනස් කළාද යන්න ගොවි කාරක සභාවට දන්වා නොමැත. එමනිසා වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම කරගෙන යා යුත්තේ කෙසේද කියා ගොවි කාරක සභාව දන්නේ නැත. මෙය ක්‍රියාත්මක වන කාල පරිච්ඡේදය තුළදී පවා ක්‍රියාත්මක කරන ආයතන සහ ගොවි කාරක සභාව අතර ද ප්‍රමාණවත් තරම් තොරතුරු හුවමාරු වන්නේ නැත. විශේෂයෙන් ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටම්වලදී මුහුණ පාන්නට සිදු වන ගැටළු ගමට දැන ගන්නට සලස්වන්නේද ඉතා කලාතුරකිනි. එබැවින් ගම් මට්ටමේදී අවශ්‍ය අනුවර්තකයන් කිරීමට හැකි වන්නේ නැත. ඉහළ මට්ටමේදී සිදු වන දුෂ්කරතාවයන් ගැන ගොවීන්ට දැන්වීම විශේෂයෙන් වැදගත් වන්නේ ගොවීන් තුළ ගොවි කාරක සභා ගැන ඇති විශ්වාසය බිඳී යාමට ඉඩ ඇති බැවිනි.

ක්‍රියාත්මක වැඩ පිළිවෙලෙහි ඇත්තාවූ අඩු පාඩු පිළිබඳවද යමක් කිව යුතුය. එය මූලික වශයෙන් වී නිෂ්පාදනය ගැන සකස් කරන වැඩ පිළිවෙලකි. ගොඩ භෝග වගාවන් සහ පශු පාලනය දියුණු කිරීම සම්බන්ධයෙන් එතරම් වැදගත් සථානයක් ලැබී නොමැත. දැනට පවත්නා නීති රීති යටතේ ගොඩ ඉඩම් සහ පශු පාලනය පිළිබඳ බලතල වුවද ගොවි කාරක සභාවට නොමැත. අලුත් ගොවි කාරක සභා පිහිටවූ විට මේ තත්වය වෙනස් වනු ඇත.

නිර්දේශ:-

1. ගොවි කාරක සභාව විසින් සියළුම ගොවීන් නියෝජනය කරනු ලැබිය යුතු අතර, ප්‍රදේශයේ ඇති සියළුම ප්‍රශ්න ගැන සැළකිලිමත් වන ක්‍රියාත්මක සංවිධානයක් බවට පත් කළ යුතුය. කෘෂිකාර්මික වැඩ පිළිවෙල සම්බන්ධයෙන් සැලසුම් සම්පාදනය කරන සහ ඒවා ක්‍රියාත්මක කරන ග්‍රාමීය මට්ටමේ කාර්යක්ෂම ආයතනයක් වශයෙන් එයට ක්‍රියාත්මක විය හැක්කේ එවිට පමණි.
2. ගොවීන්ගේ මැදිහත් වීම හා සහභාගිත්වය සංවර්ධන වැඩ පිළිවෙල සාර්ථක ලෙස සකස් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ පූර්ව අවශ්‍යතාවයන් වේ.
3. ගොවි කාරක සභා, යෙදවුම් සැපයීමේ ආයතන හා ප්‍රාදේශීය සහ දිස්ත්‍රික්ක සංවිධාන ආදිය අතර සම්බන්ධීකරණයක් ඇති කිරීම පිණිස ඉහළ මට්ටමක ගොවි සංවිධානයක් ඇති කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් දැනටමත් පිළියෙල කර ඇති එළදා වර්ධන කමිටුවේ කාර්ය භාරය වඩා පැහැදිලි කර දිය යුතු අතර රට නියම මග පෙන්වීමක් ද දිය යුතු වේ.[1]

---

1. 1974 කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද කෘෂිකර්ම වැඩ පිළිවෙලේ පෙරවදන බලන්න.

4. වැඩ පිළිවෙල සකස් කරන මෙන්ම ක්‍රියාත්මක කිරීමේ ග්‍රාමීය මට්ටම සහ ප්‍රාදේශීය/දිස්ත්‍රික් මට්ටම් අතර සම්බන්ධතාවයක් සහ කිට්ටු අදහස් හුවමාරුවක් තිබිය යුතුය. එය ක්‍රියාත්මක කිරීම සඳහා රට සම්බන්ධ සියළුම නිලධාරීන් ද, යෙදවුම් සපයන ආයතන ද (විශේෂයෙන්ම සමුපකාර සමිතිය) මෙහිදී කිට්ටුවෙන් සහභාගී වී කටයුතු කළ යුතුය.

5. සැලසුම් සම්පාදනය සහ ඒවා ක්‍රියාත්මක කිරීම යන කාර්යයන් හොඳින් භාර ගත හැකි තත්වයකට ගොවි කාරක සභා පත් කළ හැකි වන්නේ **එහි නිලධාරීන්ට නියම පුහුණුවක් සහ මග පෙන්වීමක් ලබා දුන්නොත්** පමණි.

6. ක්‍රියාත්මක වැඩ පිළිවෙල ප්‍රදේශයේ පූර්න කෘෂිකර්ම දියුණුව පිළිබඳ නිශ්චිත වැඩ පිළිවෙලක් විය යුතුය. එවිට ගොඩ ඉඩම්වලට සහ පශු පාලනයට ද වැදගත් ස්ථානයක් ලැබෙනු ඇත. මේ අනුව ප්‍රදේශයේ පූර්න කෘෂිකර්ම දියුණුව පිළිබඳ වගකීම ගොවි කාරක සභාවලට පැවරිය යුතුය. මෙය දැනටමත් කෘෂිකාර්මික ඉඩම් පනත යටතේ පිළිගෙන ඇත.

7. කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ කෙටි කාලීන සැලසුම්වලට අනුබද්ධව දිගු කාලීන සැලසුම් ද සකස් කළ යුතු වේ. මේ දිගු කාලීන සැලසුම් වලින් වාරිමාර්ග, පස් සහ ජල සම්පත් රැක ගැනීම, වගාවන් සහ පශු පාලනය පිළිබඳ වැඩ පිළිවෙලවල් සකස් කිරීම, අලෙවි කිරීම, ගබඩා කිරීම සහ පරිවහනය යන අංශ ගැන ද සැලකිලිමත් විය යුතුය.

උපලේඛන I

## කෙහෙල්පත්තල හා අළුත්නුවර ගොවි කාරක සභාවල අක්කර බදු එකතු වීම හා සුළු වාරිමාර්ග සඳහා වියදම්

| කෙහෙල්පත්තල | | : | අළුත්නුවර | |
|---|---|---|---|---|
| එකතු කරනු ලැබූ අක්කර බදු ප්‍රමාණය රු. | සුළු වාරිමාර්ග සඳහා කරනු ලැබූ වියදම් රු. | අවුරුද්ද | එකතු කරනු ලැබූ අක්කර බදු ප්‍රමාණය රු. | සුළු වාරිමාර්ග සඳහා කරනු ලැබූ වියදම් රු. |
| 271.00 | ........ | 1958 | ....... | ( |
| ...... | ........ | 1959 ) | | ( 1,823.00 |
| ...... | ........ | 1960 ) | | ( |
| ...... | ........ | 1961 ) | | ........ |
| ...... | 600.00 | 1962 ) | | ........ |
| 19.00 | 2,600.00 | 1963 ) | | ........ |
| ...... | ....... | 1964 ) | 923.00 | ........ |
| ...... | ....... | 1965 ) | | ........ |
| 1,677.00 | ....... | 1966 ) | | ........ |
| 178.00 | 6,169.00 | 1967 ) | | ........ |
| 2,778.00 | | (1968 | ....... | ........ |
| 1,997.00 | | (1969 | ....... | ........ |
| 907.00 | | (1970 | 215.00 | ........ |
| 1,496.00 | | (1971 | 273.00 | ........ |
| 2,503.00 | 60,000.00 | (1972 | ....... | ........ |
| 3,657.00 | ....... | (1973 | ....... | ........ |

ප්‍රා.අා.නි. කොට්ඨාශය: ගල්බඩ කෝරලය.
ග්‍රා. සේ. කොට්ඨාශය: කෙහෙල්පන්නල.

ගොවි කාරක සභාව: කෙහෙල්පන්නල
ප්‍රාථමික වි.සේ.ස.සමිතිය: හෙම්මාතගම.
ප්‍රාථමික වි.සේ.ස. ශාඛාව/ශාඛා: කෙහෙල්පන්නල

## ගොවි කාරක සභා මගින් ඉදිරිපත් කරන කෘෂිකර්ම යෝජනා – 1972/73

මාස් කන්නය: 1972 සැප්තැම්බර් මස සිට 1973 මාර්තු මස දක්වා.
යල් කන්නය: 1973 අප්‍රේල් මස සිට 1973 අගෝස්තු මස දක්වා.

### 1. වී ගොවිතැන

1. (අ) අඳ ගොවීන් ගණන: ... ... 63
   (ආ) ඉඩම් හිමි ගොවීන් ගණන: ... ... 128
2. අස්වද්දා ඇති මුළු ඉඩම් ප්‍රමාණය – අක්කර ... 212
   (අ) සුළු වාරිමාර්ග ක්‍රම යටතේ ... ... 202
   (ආ) වැසි ජලයෙන් පෝෂිත ... ... 10

එකතුව 212

| | මහ 72/73 | යල 1973 | පසුගිය කන්නයේ ප්‍රගතිය මහ 71/72 | පසුගිය කන්නයේ ප්‍රගතිය යල 71 |
|---|---|---|---|---|
| 3. වගා කිරීමට අපේක්ෂිත මුළු බිම් ප්‍රමාණය අක්කර | | | | |
| (අ) සුළු වාරිමාර්ග ක්‍රම යටතේ: | 202 | 202 | 202 | 202 |
| (ආ) වැසි ජලයෙන් පෝෂිත: | 10 | 10 | 10 | 10 |
| එකතුව | 212 | 212 | 212 | 212 |
| 4. වී වගා කළ හැකි එහෙත් වගා නො කරන බිම් ප්‍රමාණය – අක්කර (කරුණාකර මෙයට හේතු සහ එම ඉඩම් වගා කිරීම ගැන යෝජනා වෙනම පතක ලියා මේ සමඟ එවන්න.) | නැත | නැත | නැත | නැත |
| 5. අක්කරයකින් අපේක්ෂිත අස්වැන්න – බුසල් | 60 | 60 | 50 | 50 |
| 6. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ගොවීන් විසින් මිළදී ගැනීමට අදහස් කරන සහතික කළ බිත්තර වී ප්‍රමාණය – බුසල් | නැත | නැත | | |

අයි.ආර්. 8 ... (මාස 4)
අයි.ආර්. 262 ... (මාස 3 1/2)
බී.ජී. 11/11 ... (මාස 4 – 4 1/2)
බී.ජී. 34/6 ... (මාස 3 1/2)
බී.ජී. 34/8 ... (මාස 3)
බී.ජී. 34/11 ... (මාස 3)
එල්.ඩී. 66 ... (මාස 4–4 1/2)
එච්.අයි. 273 ... (මාස 4–4 1/2)
66 – 355එච් 4 ... (මාස 4–4 1/2)
එච් 8 ... (මාස 4–4 1/2)
එච් 9 ... (මාස 5 – 6 )
එච් 10 ... (මාස 3)
පී.ටී.බී. 16 ... (මාස 5 – 6)

| | මහ 1972/73 | යල 1973 | පසුගිය කන්නවල ප්‍රගතිය මහ 1971/72 | පසුගිය කන්නවල ප්‍රගතිය යල 1971 |
|---|---|---|---|---|
| 7. දියුණු වී වර්ග යටතේ වගා කිරීමට අදහස් කරන භූමි ප්‍රමාණය – අක්කර | | | | |
| අයි.ආර්. 8 ... (මාස 4) | | | | |
| අයි.ආර්. 262 ... (මාස 3 1/2) | | | | |
| බී.ජී. 11/11 ... (මාස 4-4 1/2) | 212 | 212 | 2 | 2 |
| බී.ජී. 34/6 ... (මාස 3 1/2) | | | | |
| බී.ජී. 34/8 ... (මාස 3) | | | | |
| බී.ජී. 34/11 ... (මාස 3) | | | | |
| එල්.ඩී. 66 ... (මාස 4-4 1/2) | | | 1 | 1 |
| එම්.අයි. 273 ... (මාස 4-4 1/2) | | | | |
| 66 – 355 | | | 180 | 180 |
| එච්. 4 ... (මාස 4-4 1/2) | | | 29 | 29 |
| එච්. 8 ... (මාස 4-4 1/2) | | | | |
| එච්. 9 ... (මාස 5-6) | | | | |
| එච්. 10 ... (මාස 3) | | | | |
| පී.ටී.බී. 16 ... (මාස 5-6) | | | | |
| පිනෝල්ටි | | | | |
| පී.පී. | | | | |
| 4 – 7 | | | | |
| එකතුව අක්කර | | | | |
| 8. පාවිච්චි කිරීමට බලාපොරොත්තු වන පොහොර ප්‍රමාණය – හොණ්ඩර | | | | |
| ටී. 2 ... | 318 | 318 | 318 | 318 |
| ටී.ඩී.ඇම්. ... | 212 | 212 | 212 | 212 |
| සංයුක්ත කැට පොහොර | | | | |
| එකතුව හොණ්ඩර | | | | |
| 9. කෙටි කාලීන ණය ප්‍රමාණයන් – රුපියල් | | | | |
| සී සෑම ... | 2200 | 2200 | | |
| බිත්තර වී ... | 1280 | 1280 | | |
| රසායනික පොහොර ... | 2320 | 2320 | | |
| රසායනික බෙහෙත් ... | 1200 | 1200 | | |
| වල් නෙලීම ... | | | | |
| පැල සිටුවීම ... | 2000 | 2000 | | |
| එකතුව රුපියල් | | | | |
| 10. විවිධ ගොවිතැන් භාවිතා ක්‍රම යටතේ වගා කිරීමට අපේක්ෂිත ප්‍රමාණයන්–අක්කර | | | | |
| (අ) බිම් සකස් කිරීම | | | | |
| 1. සී සෑමෙන් ... | 150 | 150 | 150 | 150 |
| 2. කෙටීමෙන් ... | 62 | 62 | 60 | 60 |
| 3. ට්‍රැක්ටරයෙන් ... | | | | |
| 4. වෙනත් ... | | | | |
| එකතුව අක්කර | | | | |

10. විවිධ ගොවිතැන් භාවිතා ක්‍රම යටතේ වගා කිරීමට අපේක්ෂිත ප්‍රමාණයන් - අක්කර

| | මහ 1972/73 | යල 1973 | පසුගිය කන්නයේ ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මහ 1971/72 | යල 1971 |
| (ආ) වැපිරීමේ ක්‍රම: | | | | |
| 1. කැකුලමට ... | | | | |
| 2. මඩට (සාමාන්‍ය හෝ පෙළට) | | | | |
| 3. පැල සිටුවන ලද (සාමාන්‍ය හෝ පෙළට) | 212 | 212 | 210 | 210 |
| එකතුව | 212 | 212 | 210 | 210 |
| (ඇ) වල් අස් කිරීම: | | | | |
| 1. අතින් ... | 200 | 200 | 200 | 200 |
| 2. යන්ත්‍රානුසාරයෙන් | | | | |
| 3. රසායනික ද්‍රව්‍ය යෙදීමෙන් | | | | |
| එම්.සී.පී.ඒ. | 12 | 12 | 10 | 10 |
| 3, 4 ඩී.පී.ඒ. | | | | |
| පී.සී.පී. | | | | |
| පැරකොට් (ග්‍රැමොක්සෝන්) | | | | |
| වෙනත් | | | | |
| එකතුව - අක්කර | 212 | 212 | 210 | 210 |

11. ගොවි උපකරණ අවශ්‍යතා

| | දැනට ඇති ප්‍රමාණය | 1972/73 ට අළුතින් අවශ්‍ය වන ප්‍රමාණය | | එකතුව |
|---|---|---|---|---|
| | | 72/73 මහ | 73 යල | |
| I. උදලු: | | | | |
| (අ) 7X10" ... | | | | |
| (ආ) 8X10" ... | | 25 | | |
| (ඇ) 9X9" ... | 84 | 200 | | |
| (ඈ) 10X10" ... | | | | |
| II. වල් නෙලන යන්ත්‍ර: | | | | |
| (අ) සමූපකාර සමිතිවල | | | | |
| (ආ) ගොවි කාරක සභාවල | | | | |
| (ඇ) වෙනත් | | | | |
| III. ඇට දැමීමේ උපකරණ: | | | | |
| (අ) සමූපකාර සමිතිවල | | | | |
| (ආ) ගොවි කාරක සභාවල | | | | |
| (ඇ) වෙනත් | | | | |
| IV. බල වේග ඉසිනයන් (කුඩා ඉසින ඒකාබද්ධ යන්ත්‍ර සහිත) | | | | |
| (අ) සමූපකාර සමිතිවල | | | | |
| (ආ) ගොවි කාරක සභාවල | 2 | | | |
| (ඇ) වෙනත් | | | | |

11. ගොවි උපකරණ අවශ්‍යතා (3 වෙනි පිටුවට සම්බන්ධවයි)

| | දැනට ඇති ප්‍රමාණය | 1972/73 ට අළුතින් අවශ්‍ය වන ප්‍රමාණය | එකතුව |
|---|---|---|---|
| V. අත් ඉසිනයන්: | | | |
| (අ) සමූපකාර සමිතිවල | | | |
| (ආ) ගොවි කාරක සභාවල | | | |
| (ඇ) වෙනත් | | | |
| VI. අත් කුඩු ඉසිනයන්: | | | |
| (අ) සමූපකාර සමිතිවල | | | |
| (ආ) ගොවි කාරක සභාවල | | | |
| (ඇ) වෙනත් | | | |
| VII. රෝද දෙකේ ට්‍රැක්ටර් රථ | | | |
| VIII. කටු කම්බි ගොණ්ඩර | | හො. 25 | |
| IX. කුකුල් කොටුව සඳහා කම්බි දැල් (හො.) | | හො. 20 | |

12. සහතික මිල යෝජනා ක්‍රමය යටතේ විකිණීමට බලාපොරොත්තු වන වී ප්‍රමාණය-බුසල්

| මහ 1972/73 | යල 1973 | පසුගිය කන්නයේ ප්‍රගතිය | |
|---|---|---|---|
| | | මහ 1971/72 | යල 1971 |
| | | | |

13. වගා කාල සටහන

| | 1972/73 මහ | 1973 යල |
|---|---|---|
| (අ) ඇලවල් ශුද්ධ කිරීම ආරම්භ වන දිනය | 1972-08-25 | 1973-04-03 |
| (ආ) වැපිරීම ආරම්භ වන දිනය | | |
| (ඇ) වගා ණය මුදල් ගොවීන්ට නිකුත් කළ දිනය | | |
| (ඈ) බිත්තර වී ගොවීන්ට නිකුත් කළ යුතු දිනය | | |
| (ඉ) රසායනික පොහොර ගොවීන්ට ලබා දිය යුතු දිනය | 1972-09-10 | 1973-05-10 |
| (ඊ) අස්වැන්න නෙලා ගැනීම ආරම්භ වන දිනය | 1973-03-05 | 1973-08-05 |

14. **II අතිරේක භෝග වගාව**

| | බිම් ප්‍රමාණය අක්කර | නිෂ්පාදනය ගොණ්ඩර | අවශ්‍ය බීජ ප්‍රමාණය රාත්තල් | ණය අවශ්‍ය අක්කර ප්‍රමා. |
|---|---|---|---|---|
| 1. 1. රතු ලූණු | 10 | 30 | 25 | |
| 2. අමු මිරිස් | 20 | 40 | 50 | |
| 3. මුං ඇට | | | | |
| 4. අරිතාපල් | | | | |
| 5. බී ලූණු | | | | |
| 6. මයියොක්කා | 50 | 1000 | | |
| 7. එළවළු | 100 | 10000 | | |
| එකතුව | | | | |

15. පලතුරු වගාව

| | දැනට වගා කර ඇති බිම් ප්‍රමාණය හෝ ගස් ගණන | අළුතින් වගා කිරීමට යෝජිත අක්කර ප්‍රමාණය හෝ ගස් ගණන | දියුණු කළ පැල අවශ්‍යතා |
|---|---|---|---|
| 1. අන්නාසි (අක්කර) | ගස් 6000 | ගස් 3000 | 3000 |
| 2. කෙසෙල් (අක්කර) | අක්. 350 | අක්. 400 | |
| 3. වැලි දොඩම් | | | |
| 4. අලි ගැට පේර ගස් | ගස් 50 | ගස් 50 | පැල 1000 |
| එකතුව | | | |
| මුළු බිම් ප්‍රමාණය අක්කර/හෝ | | | |
| මුළු ගස් ගණන | | | |

16. සුළු අපනයන භෝග වගාව

| | දැනට වගා කර ඇති බිම් ප්‍රමාණය හෝ ගස් ගණන | අළුතින් වගා කිරීමට යෝජිත අක්කර ප්‍රමාණය හෝ ගස් ගණන | දියුණු කළ පැල අවශ්‍යතා |
|---|---|---|---|
| 1. කොකෝවා (අක්කර) | 40 | අක්. 20 | 10000 |
| 2. කෝපි (අක්කර) | 10 | 10 | 5000 |
| 3. සාදික්කා (ගස්) | | | |
| 4. ගම්මිරිස් (අක්කර) | 100 | 150 | |
| 5. කරාබු (ගස්) | 50 | 20 | 3600 |
| එකතුව | | | |
| මුළු බිම් ප්‍රමාණය අක්කර/හෝ | | | |
| මුළු ගස් ගණන | | | |

## IV. සත්ව පාලනය

17. බෝ කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට බලාපොරොත්තු වන සතුන් ගණන:

| | | |
|---|---|---|
| කුකුළු පැටව් | බිත්තර සඳහා | 1000 |
| | බ්‍රොයිලර් (මස් සඳහා) | 200 |
| එළ වැස්සන් | ... | 10 |
| එළ නැම්බියන් | ... | 30 |
| මී වස්සන් | ... | 25 |
| මී නැම්බියන් | ... | 50 |

අ:ක:/සංවර්ධන නිලධාරී
දිනය: 1972-05-31

අ:ක:/ගොවි කාරක සභාවේ ගරු සභාපති
දිනය: 1972-05-31